චතුරාර්ය සත්‍යය අවබෝධයට ධර්ම දේශනා

මහමෙව්නා
සදහම් ප්‍රකාශන
50

# මමත් සිත සමාහිත කරමි බුදු සමිඳුනේ

- සමාධි භාවනා සූත්‍රය
- සත්තසුරියුග්ගමන සූත්‍රය

පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

මහමෙව්නා සදහම් ප්‍රකාශන - 50

# මමත් සිත සමාහිත කරමි බුදු සමිඳුනේ

ශ්‍රී බු.ව. 2550 ක් වූ වප් මස

© පූජ්‍ය කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

**පරිගණක අකුරු සැකසුම,**
**පිටකවර නිර්මාණය සහ ප්‍රකාශනය**

මහමෙව්නා සදහම් ප්‍රකාශන

මහමෙව්නා භාවනා අසපුව
වඩුවාව, පොල්ගහවෙල.
දුර / ෆැක්ස් : 037 2244602
ඊ මේල් : asapuwa1@sltnet.lk
වෙබ් අඩවි : www.mahamevna.org
www.gautamabuddha.org

**මුද්‍රණය**

ඉලේෂන් ඔෆ්සෙට් (පුද්.) සමාගම

කටුනායක ගුවන්තොටුපල,
මිනුවන්ගොඩ පාර, ආඬිඅම්බලම.
දුර : 011 2254490 / 2254636

දසබලසේලප්පභවා නිබ්බානමහාසමුද්දපරියන්තා
අට්ඨංග මග්ගසලිලා ජිනවචනනදී චිරං වහතූති

*දසබලයන් වහන්සේ නමැති ශෛලමය පර්වතයෙන් පැන නැගී*
*අමා මහා නිවන නම් වූ මහා සාගරය අවසන් කොට ඇති*
*ආර්ය අෂ්ඨාංගික මාර්ගය නම් වූ සිහිල් දිය දහරින් හෙබි*
*උතුම් ශ්‍රී මුඛ බුද්ධ වචන ගංගාව (ලෝ සතුන්ගේ සසර දුක නිවාලමින්)*
*බොහෝ කල් ගලාබස්නා සේක්වා !*

*(සළායතන සංයුත්තය - උද්දාන ගාථා)*

Internet Version of MSP

# සමාධි භාවනා සූත්‍රය

## (චිත්ත සමාධිය දියුණු කිරීම ගැන වදාළ දෙසුම)

www.gautamabuddha.org
www.mahamevna.org

*සංයුක්ත නිකාය 3 (ඛන්ධ සංයුත්තය)*

# සමාධි භාවනා සූත්‍රය

නමස්කාර වේවා! බුදු රුවනට සැම දා! බුදු හිමි සරණ යමි
නමස්කාර වේවා! දම් රුවනට සැම දා! සඳහම් සරණ යමි
නමස්කාර වේවා! සඟ රුවනට සැම දා! මහ සඟ සරණ යමි
නමස්කාර වේවා! තුනුරුවනට සැම දා! තිසරණ සරණ යමි

Internet Version of MSP www.gautamabuddha.org www.mahamevna.org

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

දැන් අපි ඉගෙන ගෙන තියෙනව, අපගේ බුදු රජාණන් වහන්සේ සුනෙත්ත කියන ශාස්තෘන් වහන්සේ විදිහට සංසාරෙ හත් වසරක් මෛත්‍රී ධ්‍යානය පුරුදු කරල, සංවට්ට කල්ප, විවට්ට කල්ප හතක් මේ ලෝකෙට පැමිණෙන්නෙ නැතිව, සුගතියේ කල් ගෙවලා, මහා බ්‍රහ්ම තනතුරේ පවා උපත ලබල ඉඳල, සක්‍රදේව තනතුරේ තිස් හය වතාවක් ඉපදිල ඉඳල, දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඇතිව සක්විති රජ වශයෙන් නොයෙක් සිය ගණන් වාර වල ඉපදිලා ඉඳලත්, සංසාරෙන් එතෙර වෙන්නට බැරිව ගියා, කරුණු හතරක් අවබෝධ නොවීම නිසා.

## අවබෝධ නොවුනු දේ

ඒ තමයි; ආර්ය ශීල, ආර්ය සමාධි, ආර්ය ප්‍රඥා, ආර්ය විමුක්ති. ඒ කාරණය බුදුරජාණන් වහන්සේ අවබෝධ කරලා, භික්ෂූන් වහන්සේලාට ප්‍රකාශ කළා, "බුදුරජාණන් වහන්සේ ආර්ය ශීලය අවබෝධ කළා; ආර්ය සමාධිය අවබෝධ කළා; ආර්ය ප්‍රඥාව සාක්ෂාත් කළා, ආර්ය විමුක්තිය සාක්ෂාත් කළා" කියල. එතකොට දැන් අපටත් ආර්ය ශීල, ආර්ය සමාධි, ආර්ය ප්‍රඥා, ආර්ය

විමුක්ති කරා ගියොත් නම්, සංසාරෙන් එතෙර වෙන්න පුව්වන් කම තියෙනවා.

මේ සියව් කරුණු වල දී අපට වැදගත් වෙන්නේ, බුදුරජාණන් වහන්සේ ගේ අවබෝධය පිළිබඳ අපේ හිතේ තිබෙන පිරිසිදු පැහැදීම යි, අපේ හිතේ තිබෙන අචල ප්‍රසාදය යි. ඒ කෙනා සීලයෙන් සංවර වෙනවා. ඒ කියන්නෙ කයෙන් සංවර වෙනවා, වචනයෙන් සංවර වෙනවා. පංච නීවරණ යටපත් වෙන ආකාරයට එයා සමාධියක් දියුණු කරන්න ඕනෑ. සමාධිය ගැන බුදු රජාණන් වහන්සේ සූත්‍ර ධර්ම වල ඉතා පැහැදිලි ලෙස දේශනා කරලා තියෙනවා. බුදුරජාණන් වහන්සේ තරම් සමාධිය ගැන දන්න කෙනෙක් ලෝකයේ වෙන නැහැ. මොකද, අපි දන්නවා උන් වහන්සේ ධර්මය ගුරු තනතුරේ තබා ගත්තේ අවබෝධයෙන් ම යි. ඉතින් ඒ නිසා බුදු රජාණන් වහන්සේ සමාධිය ගැන විස්තර හොඳට දන්නවා. උන් වහන්සේ "සමාධිය වඩන්න, මහණෙනි, සමාධිය වඩන්න" කියල දේශනා කරල තියෙනවා. අද අපි ඉගෙන ගන්නේ අන්න ඒ දේශනාව.

## සමාධියක් කුමකට ද?

මේ දේශනාවෙ නම "සමාධි භාවනා සූත්‍රය", මේ උතුම් දේශනාව ඇතුළත් වෙන්නෙ සංයුක්ත නිකායේ තුන්වෙනි කොටසට. මේ දේශනාව බුදු රජාණන් වහන්සේ වදාළේ සැවැත් නුවර ජේතවනාරාමයේ වැඩ වාසය කරන කාලයේ දි.

උන්වහන්සේ භික්ෂූන් වහන්සේලා අමතල මෙන්න මෙහෙම වදාළා. (සමාධිං භික්ඛවේ, භාවේථ) "මහණෙනි,

සමාධිය දියුණු කරන්න." භාවේත කියන්නෙ දියුණු කරන්න, ප්‍රගුණ කරන්න කියන එක. **(සමාහිතෝ භික්ඛවේ, භික්ඛු යථාභූතං පජානාති)** "මහණෙනි, සමාධිමත් සිත් ඇති භික්ෂුව, යථාර්ථය අවබෝධ කරනව." එහෙම නම් අපට පේනවා යථාර්ථය අවබෝධ කර ගැනීමේ දි අපට සමාධිය දියුණු කර ගැනීම අවශ්‍ය යි. සාමාන්‍ය ජීවිතයේ දි අපට සාමාන්‍ය විදිහට දකින්න බැරි යථාර්ථය, සමාධිමත් සිතකින් දකින්න පුළුවන්.

Internet Version of MSP www.gautambuddha.org www.mahamevna.org

## මෙන්න අවබෝධ කළ යුතු යථාර්ථය

බුදුරජාණන් වහන්සේ මෙහෙම අහනවා. "මහණෙනි, මේ සමාධිමත් හිත් ඇති කෙනා කවර යථාර්ථයක් ද අවබෝධ කරන්නේ? එයා අවබෝධ කරන්නේ මෙන්න මේකයි." බුදු රජාණන් වහන්සේ පෙන්වා දෙනවා, "සමාධිමත් සිත් ඇති කෙනා රූප උපාදාන ස්කන්ධයේ හටගැනීමත්, නැතිවීමත් අවබෝධ කරනවා; වේදනා උපාදාන ස්කන්ධයේ හට ගැනීමත්, නැතිවීමත් අවබෝධ කරනවා; සංඥා උපාදාන ස්කන්ධයේ හට ගැනීමත්, නැතිවීමත් අවබෝධ කරනවා; සංස්කාර උපාදාන ස්කන්ධයේ හට ගැනීමත්, නැතිවීමත් අවබෝධ කරනවා; විඤ්ඤාණ උපාදාන ස්කන්ධයේ හට ගැනීමත්, නැතිවීමත් අවබෝධ කරනවා." මෙන්න මේ කරුණු අවබෝධ කර ගැනීම පිණිස යි, අපි සමාධියක් වැඩිය යුත්තේ.

## ප්‍රඥාව ඉබේ වැඩෙනව ද?

යථාර්ථය අවබෝධ කිරීම ගැන සමහරු කියනවා "නෑ, නෑ, සමාධියක් වැඩුවහම ඇති, ප්‍රඥාව ඉබේ වැඩෙයි" කියල. සිදුවෙයි ද, නැද්ද? එහෙම සිදු වෙන්නෙ නෑ.

මට මතකයි මම හිමාලයේ කල් ගෙවන කාලෙ ඔය තාපසවරු බොහොම ළඟින් ඇසුරු කරන්නට ලැබිලා තියෙනවා. සමාධිය දියුණු කරන තාපසවරු පවා ප්‍රඥාව අහලකටවත් ඇවිල්ල නෑ. ඒ අනුව අපට පේනවා ප්‍රඥාව ලබා ගැනීමට ආසන්න කාරණය හැටියට සමාධිය තිබුනාට සද්ධර්මය ශ්‍රවණයෙන් ලත් දැනුම සම්පූර්ණයෙන් ම එයාගේ දියුණුවට උපකාර වෙනවා. ඒ සද්ධර්ම ශ්‍රවණය නැති නිසා ඒ හිමාල තාපසවරු සමාධිය දියුණු කළාට සක්කාය දිට්ඨිය ප්‍රහාණය කරන්ට බැහැ. ඒ මොකද? පංච උපාදාන ස්කන්ධය හට ගන්නා ආකාරය අවබෝධ කරලත් නෑ. නැති වී යන ආකාරය අවබෝධ කරලත් නෑ. ඒ නිසා සමාධිය දියුණු කරන එක විතරයි කරන්න තියෙන්නේ. අපට එහෙම නෙමෙයි; සමාධිය දියුණු කරල, ප්‍රඥාව දියුණු කරල, විමුක්තිය කරා යන්න මේ ධර්ම මාර්ගය කියල දෙනව. බුදුරජාණන් වහන්සේ එතකොට වදාළේ සමාධිය වඩන්න, සමාහිත සිත් ඇති කෙනාට යථාර්ථය අවබෝධ කරන්න පුළුවන් කියල.

## අවබෝධ කරගන්න, රූපයේ යථාර්ථය...

එතකොට යථාර්ථය හැටියට අවබෝධ කරන්න තියෙන්නෙ මොකක් ද? රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ කියන උපාදාන ස්කන්ධයන් ගේ හට ගැනීමත්, නැති වී යාමත්. බුදුරජාණන් වහන්සේ අහනවා මෙහෙම, "මහණෙනි, මොකක් ද මේ රූප උපාදාන ස්කන්ධයේ හට ගැනීම කියන්නෙ? මහණෙනි, මෙහිලා භික්ෂුව **(අභිනන්දති)** අභිනන්දති කියන්නේ සතුටින් පිළිගන්නවා. **(අභිවදති)** ගුණ කියනවා. **(අජ්ඣෝසාය තිට්ඨති)** හිත බැසගෙන පවතිනවා. මොකක් ගැන ද? මේ හිත බැස

ගන්නේ, ගුණ කියන්නෙ, මේකෙ තියෙනවා; **(රූපං අභිනන්දති)** රූපය කියන්නෙ මොකක් ද? පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන සතර මහා ධාතූන් හා ඒ සතර මහා ධාතූන් ගෙන් හට ගත් දේවල් වලට තමයි, රූප කියන්නෙ. රූප කියන්න හේතුව මොකක් ද? **(රුප්පතීති භික්ඛවේ, තස්මා රූපන්ති වුච්චති)** නැසී වැනසී යන නිසයි, මේ සතර මහා ධාතූන්ගෙන් හටගත් දේවල් වලට රූපය කියල කියන්නේ. උන් වහන්සේ වදාළා මේක සීතලෙන් නැසිල යනවා, උණුසුමෙන් නැසිල යනවා, ජලයෙන් වැනසිලා යනවා, විනැම දෙයකින් නැසිලා වැනසිලා යන නිසා සතර මහා ධාතූන්ගෙන් හටගත් දේවල් වලට කියනවා රූප කියල.

## රූපේ මහද පිනා යයි...

අන්න ඒක මොකද කරන්නෙ? **(අභිනන්දති)** සතුටින් පිළිගන්නවා, මම කියල පිළිගන්නවා, මගේ කියල පිළිගන්නවා, මගේ ආත්මය කියල පිළිගන්නවා. **(අභිවදති)** ගුණ කියනවා. "ෂා... මේ බලන්න මගේ කොණ්ඩෙ ලස්සන. මේ බලන්න නියපොතු" ගුණ කියනව. ගුණ කියන්න කියන්න මොකද වෙන්නෙ? ඒකෙ හිත බැසගන්නවා. වෙනව ද? නැද්ද? වෙනවනෙ. "මෙන්න මම ඔයාට රස කෑමක් ගෙනාවා. මෙන්න පුඩිමක් ගෙනාවා." ඔන්න කෑල්ලක් අරන් කාලා "ෂා... හරි රසයි" කියල කියනවා. "කොහෙන්ද ගත්තේ?" කියල අහනවා. මොකද? අභිනන්දති, අභිවදති, අජ්කෙධාසාය තිට්ඨති. මෙයාගෙ හිත යනවා මේකට.

මෙන්න මේ වගේ අපේ හිත මේ රූපයට බැස ගන්නවා. මේක ලේසියෙන් අත්හරින්න බැරි දෙයක්. වික

තමයි ලෝකේ තියෙන්නෙ. ලෝකෙ ඔයිට වඩා අමතර දෙයක් නෑ. ඔය කරුණු තුනෙන් තමයි, මේ ලෝකෙ තියෙන්නෙ. මොකක් ද කරුණු තුන. අභිනන්දති, අභිවදති, අජ්ඣෝසාය තිට්ඨති.

## සතුටින් පිළිගත්තා ද රූපය? එහෙනම්...

මේ වගේ රූපය ගැන එයා කල්පනා කරනවා, හිත බැස ගන්නවා. රූපය සතුටින් පිළිගනිද්දි, බැස ගනිද්දී, **(උප්පජ්ජති නන්දි)** ආසාවක් හට ගන්නවා. **(යා රූපේ නන්දි තදුපාදානං)** රූපය කෙරෙහි යම් ආශාවක් ඇද්ද ඒක තමයි, බන්ධනය. හැබැයි මේක අවබෝධ කරන්න නම් චිත්ත සමාධිය දියුණු කරන්න වෙනෙ. **"යා රූපේ නන්දි"** - රූපය කෙරෙහි යම් ආශාවක් ඇද්ද, **"තදුපාදානං"** - ඒක තමයි බන්ධනය. ඊට පස්සෙ එයා මොකද කරන්නෙ? බැඳුනට පස්සෙ **(තස්ස උපාදාන පච්චයා භවෝ)** ඒ බැඳුණු හිතින් යුක්තව එයා කටින් කතා කරනවා, කයින් ක්‍රියා කරනවා, හිතින් හිතනවා. එතකොට මොක ද වෙන්නෙ? කර්මය උපදිනවා. කර්මය සකස් වෙනවා, විපාක පිණිස. ඊට පස්සෙ **(භව පච්චයා ජාති)** ඒ නිසා උපදින්න සිද්ධ වෙනවා. අයෙමත් උපතක් කරා යනවා. **(ජාති පච්චයා ජරා මරණං, සෝක පරිදේව, දුක්ඛ දෝමනස්සුපායාසා සම්භවන්ති)** ඉපදීම නිසා ජරා, මරණ, ශෝක, වැලපීම්, දුක්, දොම්නස් හටගන්නවා.

මීට කලින් ජීවිතයක දි අපිට මේක වුනා. මොකද වුනේ? අපි රූපය පිළිගත්තා, ගුණ කිව්වා, බැස ගත්තා. ඔන්න උපතක් කරා අපි ආවා. දැන් අපිට ජරා මරණ නැද්ද? තියෙනව ද? දැනුත් අපි කරන්නේ ඒක ම නේද? රූපය පිළිගන්නවා, රූපයේ ගුණ කියනවා, ඒකෙ බැස

ගන්නවා. යමක ගුණ කියනවා නම්, ඒකෙ බැස ගන්නවා ම යි. ඔන්න මේ අවුරුද්දෙ රූප රැජිණී තෝරනවා. බැස ගන්නෙ නැද්ද එතකොට. "අනේ බලන්නකෝ ලස්සන, අනේ මේ වගේ ඇස් දෙකක් මටත් ඇත්නම්, මේ වගේ ඉඟ සුඟ මටත් ඇත්නම්" කල්පනා කරනවා දැන්. තෝරල දෙනවා දැන් මෙන්න ලස්සනයි කියලා. මොකද මේ කරන්නේ? "අභිනන්දති, අභිවදති, අජ්ඣෝසාය තිට්ඨති" මේ ලෝකේ යන්නේ ඔහොම යි. කලාතුරකින් කෙනෙක් ඒකේ යථාර්ථය දකින්න හිත යොමු කරනවා. එතකොට පේනවා මේ රූපය තමයි ආයෙ ආයේ දුක පිණිස හැදෙන්නෙ. අන්න එයා සමාධිමත් සිතකින් ඒක අවබෝධ කරනවා.

## මෙන්න, රූපය නිසා දුක හැදෙන හැටි...

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා ඔන්න ඒ විදිහට තමයි, දුක හට ගන්නේ කියල. එතකොට රූපය පවතින නිසයි, දුක හට ගන්නෙ. රූපයේ හට ගැනීම කියන්නේ දුකේ හට ගැනීම යි.

දැන් අපි දන්නවා, රූපය කියන්නෙ මොනව ද? කෙස්, ලොම්, නිය.... ආදිය. පිත, සෙම, සැරව ..... ආදිය. ඊළඟට තේජෝ ධාතුවට අයත් දේ. වායෝ ධාතුවට අයත් දේවල්. මේවා නේද අපි මේ අල්ලගෙන ඉන්නෙ? මේවා හැදෙනවා, ආයෙ ආයෙමත් මේ වගේ දේවල් අපට ලැබෙනව.

## අවබෝධ කරන්න වේදනාවේ යථාර්ථයත්...

බුදු රජාණන් වහන්සේ වදාළා එයා වේදනාවත් සතුටින් පිළිගන්නවා. ඒ විඳීමත් සතුටින් පිළිගන්නවා.

**(අභිනන්දති)** ඊළඟට **(අභිවදති)** එහි ගුණ කථා කරනවා. **(අජ්ඣෝසාය තිට්ඨති)** එතකොට ඒකෙ හිත බැස ගන්නවා, ඵක තමයි ලෝකයේ තිබෙන ස්වභාවය. දැන් මේ වේදනාව කියන්නේ විඳීම නේද? **(වේදියතීති ඛෝ භික්ඛවේ, තස්මා වේදනාති වුච්චති)** විඳිනවා කියන අර්ථයෙන් තමයි, වේදනාව කියන්නේ. එතකොට මේ වේදනාව හට ගන්නේ මොකෙන් ද? ස්පර්ශයෙන් හට ගන්නේ, ඒ කියන්නේ සැපක් හරි, දුකක් හරි, උපේක්ෂාවක් හරි තියෙන විඳීමක් හට ගන්න නම්,

- ඇහැ යි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ඕනෙ. **(ඇහේ ස්පර්ශය)**
- කණ යි, ශබ්දය යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ඕනෙ. **(කණේ ස්පර්ශය)**
- නාසය යි, ගඳ සුවඳ යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ඕනෙ. **(නාසයේ ස්පර්ශය)**
- දිව යි, රසය යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ඕනෙ. **(දිවේ ස්පර්ශය)**
- කය යි, පහස යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ඕනෙ. **(කයේ ස්පර්ශය)**
- මනස යි, අරමුණු යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ඕනෙ. **(මනසේ ස්පර්ශය)**

Internet Version of MSP www.gautamabuddha.org www.mahamevna.org

ස්පර්ශයෙන් තොරව විඳීමක් හට ගන්නෙ නැහැ. එතකොට මේ අනිත්‍ය වූ ස්පර්ශයෙන් හට ගන්නා අනිත්‍ය වූ විඳීම පිළිගන්නවා. එයා දුකත් පිළිගන්නවා; සැපත් පිළිගන්නවා; උපේක්ෂාවත් පිළිගන්නවා.

## වේදනාවේ බැස ගත් සිත...

දැන් අපට පැහැදිලිව ම පේනවා මිනිස්සු දුක

පිළිගන්න හැටි. දුක් විඳින අයට ගිහින් කියන් බලන්න “අඬන්න එපා” කියල. නවත්වයි ද බලන්න. නවත්වනව ද?

මේ ළඟදි ආවා අම්මා කෙනෙක්, සුනාමි සිදුවීමත් එක්ක ම. මම ඒ අම්මට කිව්වා, “මම ඔය අම්මට අඬන්න එපා කියන්නෙ නෑ. මම ඔය අම්මට දුක් විඳින්න එපා කියන්නෙත් නෑ. ඒ මොකද හේතුව, මම අඬන්න එපා කිව්වට ඔය අම්මට නාඬා ඉන්න බෑ. ඇඬෙනවා. මම දුක් විඳින්න එපා කිව්වට ඔය අම්මට දුක් විඳින්නෙ නැතිව ඉන්න බෑ. දුක හිතෙනවා. මම ඔය අම්මට වෙන එකක් කියන්නම්. ඔය දුක් විඳින කරුණ අවබෝධ කර ගන්න.” එතකොට තමයි අම්මගේ ඇඬිල්ල නැවතුනේ.

ඉතින් මේ වගේ දුක කියන එක, ඒ දුක විඳ විඳ පිළිගන්නව එයා. ඒකෙ ගුණ කියනවා. ඒකෙ සිත බැස ගන්නවා. සැප වේදනාවෙත් බැස ගන්නවා. උපේක්ෂා වේදනාවෙත් බැස ගන්නවා. එතකොට මොකද වෙන්නෙ. විඳීමේ සිත බැස ගන්න කොට **(උප්පජ්ජති නන්දි)** ආශාවක් හට ගන්නවා. සමහරු හිතා ගෙන ඉන්නෙ දුක් විඳින කොට අවබෝධ වෙනවා කියල. ඒක සම්පූර්ණ අසත්‍යයක්. ඒක වෙන්නෙ නෑ. හොඳම උදාහරණය තමයි මේ සුනාමි සිදුවීමත් එක්ක මිනිස්සුන්ගෙ හැම දෙයක් ම නැති වුනා. සමහරුන්ට ඇඳි වතත් අහිමි වුනා. දූ දරුවො නැති වුනා. පවුලේ සියව් දේ නැති වුනා. කවුරුවත් ඉන්නව ද “මට දැන් ජීවිතේ අවබෝධ වෙලා ඉන්නෙ, ඒ නිසා මම දැන් මේකෙන් එතෙර වෙන්න ඕනෙ” කියල කියපු? නෑ. දැන් පේනව ද, දුක් විඳලා අවබෝධ කෙරෙන්නෙ නැති බව.

දැන් අපි මේකෙන් තේරුම් ගන්න ඕනෙ මේ සිත කොයි තරම් දුරට අපිව සංසාරෙට ඇද දාල තියෙනව ද කියල. මේ පංච උපාදාන ස්කන්ධයට කොයි තරම් අපි මුලාවෙලා තියෙනව ද? ඉතින් වේදනාව ඇති වුනාට පස්සෙ ආශාව උපදිනවා. **(යා වේදනාය නන්දි තදුපාදානං)** වේදනාව පිළිබඳ, තමන් විඳින දේ ගැන යම් ආශාවක් තියෙනව ද, අන්න ඒකට එයා බැඳෙනවා. ආශාවක් ඇතිවුනා ද, ඒක තමයි බැඳීම. විඳීම කෙරෙහි යම් ආශාවක් ඇත් ද එයයි උපාදානය. ඊට පස්සේ **(තස්ස උපාදාන පච්චයා භවෝ)** අන්න එයාට ඒක හේතු කරගෙන තමයි විපාක පිණිස කර්ම සකස් වෙන්නෙ. එයා එතකොට ආයෙමත් උපතක් කරා යනවා. ඊට පස්සෙ ජරා, මරණ, ශෝක, වැලපීම්, දුක්, දොම්නස් සියල්ල මෙයාට හිමි වෙනවා.

## කඩතුරාව හැර...

හැබැයි පින්වතුනි, මේ සිදුවීම සිදුවන අකාරය හොඳ සිහියෙන් බලන්න ඕනෙ. එහෙම නැත්නම් කඩතුරාවකින් වැහිල වගේ අපේ සිත සම්පූර්ණයෙන් ම අවිද්‍යාවෙන් වැහිල තියෙන්නෙ. ඒ කඩතුරාව ඉරල දමන්න නම්, යෝනිසෝ මනසිකාරයේ යෙදෙන්න ම ඕනෙ. එහෙම යෝනිසෝ මනසිකාරයේ යෙදෙන කෙනාට **වේදනාවේ හටගැනීම කියල වදාළ, වේදනා උපාදාන ස්කන්ධය මුල් කරගෙන පටිච්ච සමුප්පාදය හැදෙන ආකාරය තමා තුළින් ම දකින්න පුළුවන්.**

## සඤ්ඤා උපාදාන ස්කන්ධයේ යථාර්ථය...

ඊළඟ එක සඤ්ඤාව. සඤ්ඤාව කිව්වෙ හඳුනා ගැනීම. ඇහෙන් හඳුනා ගන්නෙ මොනව ද? රූප. ඒක

රූප සඤ්ඤා. (මේ විදිහට අනෙක් ආයතනය පහ ගැනත් බලන්න.) ඇහෙන් රූපයක් හඳුනගන්න නම්, මොකද වෙන්න ඕනෙ. ඇහැ යි, රූපය යි, විඤ්ඤාණය යි එකතු වෙන්න ඕනෙ. අන්න එතකොට එයා අඳුන ගන්නවා. එහෙනම් අඳුන ගන්නවා කියන එක ස්පර්ශයෙන් හැදෙන එකක්. එතකොට රූප සඤ්ඤාව කියන එක හැදෙන්නෙ මොකෙන් ද? ඇසේ ස්පර්ශයෙන්. ශබ්ද සඤ්ඤාව හැදෙන්නේ මොකෙන් ද? කණේ ස්පර්ශයෙන්. මේ විදිහට ම තමයි ඔක්කොම ආයතන වල සඤ්ඤාව හැදෙන්නෙ.

බුදු රජාණන් වහන්සේ වදාළා, ඔය සඤ්ඤාව අපි මොකද කළේ? සතුටින් පිළිගත්තා. පිළිඅරගෙන මොකද කරන්නෙ? එහි ගුණ කියනවා. හඳුනාගත්තු රූපය, ශබ්දය, ගඳ සුවඳ, රස, පහස, අරමුණු ගැන ගුණ කියනවා. ඉතින් ඒවා ගැන අගය කරනවා ඉවරයක් නෑ. එතකොට සතුටෙන් පිළිගැනීම යි, අගය කිරීම යි ඇති වෙච්ච තැන මොකක් ද තියෙන්නෙ? (**අජ්ඣෝසාය තිට්ඨති**) බැස ගැනීම යි.

ඒ විදිහට ම "රූප සඤ්ඤාව" කෙරෙහි සිත බැස ගන්නවා. "ශබ්ද සඤ්ඤාව", "ගන්ධ සඤ්ඤාව", "රස සඤ්ඤාව", "ඵොට්ඨබ්බ සඤ්ඤාව", "ධම්ම සඤ්ඤාව" කෙරෙහි සිත බැස ගන්නවා. එතකොට මොකද වෙන්නෙ, ආශාව උපදිනවා. මොකක් ගැන ද උපදින්නෙ? හඳුනා ගන්නා දේ ගැන. එතකොට හඳුනා ගන්නා දේ ගැන යම් ආශාවක් ඇද්ද, ඒක තමයි බන්ධනය. ඒක තමයි උපාදානය. එතකොට ඒ උපාදානය මුල් කරගෙන විපාක පිණිස කර්ම සකස් වෙනවා. ඊට පස්සෙ උපතක් කරා යනවා. එහෙම නම් අපි මතක තියා ගන්න ඕනෙ, අපි උපතක් කරා ගියේ, ඔය සිදුවීම අප තුළ සිදුවෙමින් තිබෙන

නිසා මිසක් වෙන කරුණක් නිසා නෙවෙයි. ඔය සිදුවීම අප තුළ නැති වුනා නම්, අපි සංසාරයෙන් නිදහස්. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා එයා සඤ්ඤාවේ හට ගැනීම ගැනත් අවබෝධ කරනවා කියල.

## මෙන්න සංස්කාර වල හටගැනීම

බුදුරජාණන් වහන්සේ වදාළා, සංස්කාරයේ හට ගැනීමත් අවබෝධ කළ යුතුයි කියල. සංස්කාර කිව්වෙ මොනව ද? මෙතන චේතනාව තමයි සංස්කාර කිව්වෙ. ඇහෙන් රූපයක් දැක්කහම ඒ රූපය කෙරෙහි චේතනාව ඇති වෙනවා. කණට ඇසෙන ශබ්ද ගැන චේතනා ඇති වෙනවා. නාසයට දැනෙන ගඳ සුවඳ ගැන, දිවට දැනෙන රසය ගැන, කයට දැනෙන පහස ගැන, සිතට සිතෙන අරමුණු ගැන චේතනා ඇති වෙනවා. **මේක දකින්න නම් සමාධිය ම දියුණු කරන්න ඕනෙ. එතකොට තමයි මේක අල්ලගන්න පුළුවන් වෙන්නෙ.**

චේතනාව කියන එක ඉබේ හටගන්නෙ නෑ. චේතනාව හට ගන්නෙ මොකෙන් ද? ස්පර්ශයෙන්. ඇහෙන් හටගන්නා චේතනා වලට අපි කියනවා, **"රූප සංචේතනා"** කියල. කණේ හටගන්නා චේතනා වලට කියනවා **"ශබ්ද සංචේතනා"** කියල. නාසයේ හටගන්නා චේතනා වලට කියනවා **"ගන්ධ සංචේතනා"** කියල. දිවේ හටගන්නා චේතනා වලට කියනවා **"රස සංචේතනා"** කියල. කයේ හටගන්නා චේතනා වලට කියනවා **"ඵොට්ඨබ්බ සංචේතනා"** කියල. ඒ වගේ ම මනසේ ඇතිවෙන චේතනා වලට කියන්නෙ **"ධම්ම සංචේතනා"** කියල.

අන්න ඒ චේතනාව අපි පිළිගන්නවා. පිළිගත්තට පස්සෙ මොකද කරන්නෙ, ඒක අගය කරනවා. රූප සංචේතනාව පහළ කර කර ඒකෙ ගුණ කියනවා. එතකොට මොකද වෙන්නෙ. ඒක සිතේ බැස ගන්නවා. බැස ගත්තට පස්සෙ චේතනා කෙරෙහි ආශාව උපදිනවා. සමාධියක් තුළ ඉන්න කොට ඒක හොයන්න පුළුවන්.

ඔන්න ඔය විදිහට මේ රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ, ධම්ම සංචේතනා මේ හැම එකක් කෙරෙහි ම ආශාව තියෙනවා. සංස්කාර කෙරෙහි යම් ආශාවක් ඇත් ද, ඒ ආශාව ම යි උපාදානය. උපාදානය නිසා විපාක පිණිස කර්ම සකස් වෙනවා. විපාක පිණිස කර්ම සකස් වීම නිසා උපතක් කරා ම යනවා. ඊට පස්සේ මොකද වෙන්නෙ? ඉපදුනා නම් ජරා මරණ විඳ විඳ යන්න වෙනෙ.

## චේතනාව කර්මය යි

චේතනාව නිසා කයෙන් ක්‍රියා කරන කොට, වචනයෙන් ක්‍රියා කරන කොට, හිතෙන් ක්‍රියා කරන කොට කර්ම හැදෙනවා. කර්ම විපාක හැදෙනවා, තුන් ආකාරයකින්. එක්කෝ කර්ම විපාක හැදෙනවා දිට්ඨ ධම්මවේදනීය. ඒක මේ ජීවිතයේ දි ම විපාක දෙනවා. එහෙම නැත්නම්, උපපජ්ජවේදනීය. ඊළඟ ජීවිතයේ දී විපාක දෙනවා. අන්තිම විදිහ තමයි අපරාපරීයවේදනීය. පිරිනිවන්පාන තාක් කල් ම සංසාරයේ විපාක දෙනවා.

මේක අවබෝධ කිරීමෙන් තොරව විසඳ ගන්න කිසි ම ක්‍රමයක් නෑ. මේ කරුණ තේරෙන කෙනෙක් අකමැති වෙන්න වෙනෙ ආයෙමත් ඉපදීමට. නමුත් මේ උපදින එක සිද්ධ වෙනවා, මේ සිදුවීම සිද්ධ වෙන කල් ම. මේ ධර්මය

හොඳට පැහැදිලි කර ගන්න කොට තේරුම් ගන්න පුළුවන් මෙතන සිද්ධ වෙන්නෙ හේතු ඵල දහමක් කියල.

## විඤ්ඤාණයේ හට ගැනීමත් අවබෝධ කරමු.

ඊළඟට බුදු රජාණන් වහන්සේ වදාළා විඤ්ඤාණයත් පිළිගන්නවා. විඤ්ඤාණය හට ගන්නෙ කොහොම ද? ඇහේ හට ගන්නවා **"චක්ඛු විඤ්ඤාණය"**. කණේ හට ගන්නවා **"සෝත විඤ්ඤාණය"**. නාසයේ හට ගන්නවා **"ඝාන විඤ්ඤාණය"**. දිවේ හට ගන්නවා **"ජිව්හා විඤ්ඤාණය"**. කයේ හට ගන්නවා **"කාය විඤ්ඤාණය"**. මනසේ හට ගන්නවා **"මනෝ විඤ්ඤාණය"**. වෙන තැන් වල හට ගන්නෙ නැද්ද? නෑ. ඇයි ඒ? නාම රූපයෙන් හට ගත් යමක් ඇද්ද, අන්න එතැන තමයි, විඤ්ඤාණය හටගන්නෙ. මොකද හේතුව, විඤ්ඤාණය නාම රූපයෙන් හට ගත්තු එකක් නිසා. එතකොට ආයතන හය ම නාම රූපයෙන් හටගත්තු දේවල්. ඒ නිස යි, විඤ්ඤාණය හටගන්නේ.

එතකොට **(විජානාතීති බෝ භික්ඛවේ, තස්මා විඤ්ඤාණන්ති වුච්චති)** විශේෂයෙන් දැනගන්නවා කියන අර්ථය තමයි විඤ්ඤාණය කියන එකේ තියෙන්නෙ. ඇහෙන් රූපයක් දිහා බලද්දි ඇහැ යි, රූපය යි, සම්බන්ධ වෙන්නෙ විඤ්ඤාණය නිසා. **(ද්වයං පටිච්ච භික්ඛවේ, විඤ්ඤාණස්ස සම්භවෝ හෝති)** විඤ්ඤාණයේ සම්භවයට ඇහැ යි, රූපය යි කියන දෙක ම හේතු වෙනවා. එතකොට තමයි විඤ්ඤාණය උපදින්නේ. එතකොට එයා මේවා සමාධියකින් බලද්දි බලද්දි තේරුම් ගන්නවා මෙන්න මේ විදිහට යි, විඤ්ඤාණය හටගන්නේ කියල.

බුදු රජාණන් වහන්සේ වදාළා, නාම රූපයෙන් හටගත්තු විඤ්ඤාණය ගැන මෙයාට අවබෝධයක් නෑ. ඒ නිසා **(අභිනන්දති)** සතුටින් පිළිගන්නව. පිළි අරගෙන මොකද කරන්නෙ, **(අභිවදති)** සතුටින් කතා කරනව. බොහෝ දේවල් කියනව විඤ්ඤාණය ගැන. එතකොට අපිට පේනව, මේ ඇස, කණ කියන ආයතන හයේ විතරයි විඤ්ඤාණය හට ගන්නෙ. මේ විඤ්ඤාණ සතුටින් පිළිගන්නව. **(අජ්ඣෝසාය තිට්ඨති)** පිළිඅරගෙන ඒ තුළ සතුටෙන් බැස ගන්නවා.

Internet Version of MSP

එතකොට මොකද වෙන්නෙ, විඤ්ඤාණය කෙරෙහි ආශාවක් උපදිනවා. **(යා විඤ්ඤාණේ නන්දි තදුපාදානං)** විඤ්ඤාණය කෙරෙහි යම් ආශාවක් ඇද්ද, ඒක තමයි උපාදානය. එතකොට මොකද වෙන්නෙ, ඒ උපාදානය හේතු කරගෙන කර්ම හැදිලා උපතක් කරා යනවා.

## පංච උපාදාන ස්කන්ධයේ ම හට ගැනීම

විඳීම ඇති වෙන කොට ස්පර්ශය තියෙනවා. ස්පර්ශය තුළ විඤ්ඤාණය තියෙනව ද? නැද්ද? තියෙනවා. එතකොට ස්පර්ශයෙන් තමයි විඳීම හටගන්නෙ. ස්පර්ශය තුළ විඤ්ඤාණය තියෙනවා. යමක් හඳුනාගත්තේ ස්පර්ශයෙන්. හඳුනන තැන විඤ්ඤාණය තියෙනවා. චේතනා පහළ කරන තැනත් විඤ්ඤාණය තියෙනවා. එහෙනම් වේදනාව, සඤ්ඤාව, චේතනාව කියන කොහොත් වැඩෙන්නෙ මොකක්ද? විඤ්ඤාණය. එතකොට මේ විඤ්ඤාණය උපතක් කරා යන එක වලක්වන්නට විදිහක් නෑ. ඔන්න ඒක අවබෝධ කර ගත්තා නම් එයා අවබෝධ කරනවා පංච උපාදාන ස්කන්ධය ම හට ගන්නා හැටි. බුදු රජාණන් වහන්සේ

www.gautamabuddha.org www.mahamevna.org

වදාළා වික තමයි පංච උපාදාන ස්කන්ධයේ ම හට ගැනීම කියලා.

## අවබෝධය මෙයයි

එතකොට දැන් සමාහිත සිත් ඇති කෙනා ඒක ඔය ආකාරයෙන් ම අවබෝධ කරනවා. මෙන්න මෙහෙමයි මේක සිද්ධ වෙන්නෙ කියල. එතකොට එයා දුක අවබෝධ කරල තියෙනවා. දුක හට ගන්නා හේතුව අවබෝධ කරල තියෙනව. එහෙම නම් එයා දැන් මොකද කරන්න ඕනෙ. දුක අතහරින්න නම්? දුක අවබෝධ කරන්න ඕනෙ. අවබෝධ කළාට පස්සේ දුක හට ගන්නා හේතුව ප්‍රහාණය වෙනවා.

## දුක නැතිවෙන්නෙ මෙහෙමයි

බුදුරජාණන් වහන්සේ එතකොට වදාළා, “මහණෙනි, මොකක් ද මේ රූපයේ නැති වීම කියන්නෙ, මේ රූපයේ, වේදනාවේ, සඤ්ඤාවේ, චේතනාවේ, විඤ්ඤාණයේ නැති වීම කියන්නේ?” **(ඉධ භික්ඛවේ, භික්ඛු නාභිනන්දති)** එයා පිළිගන්නෙ නෑ. මොකක් ද? රූපය පිළිගන්නෙ නෑ, මම කියල, මගේ කියල, මගේ ආත්මය කියල. ඇයි පිළිගන්නෙ නැත්තෙ? සමාහිත සිත් ඇති කෙනා රූපය විමස විමස බලනවා. එයා බලද්දි පේන්නේ මොකක් ද? පෙණ ගුලියක් වගේ නැසී වැනසී යන එකක්. කොච්චර ඇත්තක් ද බලන්න.

පෙණ ගුලියක් වගේ රූපය අවබෝධ කරන කෙනා මේ රූපය පිළිගන්නෙ නෑ, මේ රූපය මම කියල හරි, මගේ කියල හරි, මගේ වසඟයේ පවත්වන්න පුළුවන් කියල හරි.

**(අනභිවදති)** ගුණ කියන්නෙ නෑ එයා. බුදු රජාණන් වහන්සේ ධාතු මනසිකාරයෙන් මේ රූපය දිහා බලන්න කීවෙ කොහොම ද? ගව දෙනක් හතර මං හන්දියක කපල තියාගෙන ඉන්නවා වගේ මේ කය දිහා බලන්න කිව්වා.

## යථාර්ථය දකින්නේ බුද්ධිමත් අය විතරයි

යථාර්ථය දකින්නෙ වයසට ගිහිල්ල නෙවෙයි, යථාර්ථය දකින්නෙ තරුණ අවදියෙත් නෙවෙයි, කුඩා අවදියෙත් නෙවෙයි. යමෙක් බුද්ධිමත් නම් ඔහු තමයි යථාර්ථය දකින්නෙ. බුද්ධිමත් කෙනා වයසට ගිය කෙනෙක් වෙන්නත් පුළුවන්; තරුණ කෙනෙක් වෙන්නත් පුළුවන්; ළදරුවෙක් වෙන්නත් පුළුවන්.

බුද්ධිමත් කෙනා රූපය පිළිගන්නෙ නෑ. රූපයේ ගුණ කියන්නෙ නෑ. එතකොට මොකද වෙන්නෙ? **(යා රූපේ නන්දි සා නිරුජ්ඣති)** රූපය කෙරෙහි යම් ආශාවක් තිබුන ද, අන්න ඒක නිරුද්ධ වෙලා යනවා. බලන්න කොච්චර පැහැදිලි ද මේ ධර්මය. එතකොට රූපය කෙරෙහි තිබුණු ආශාව නිරුද්ධ වුනා නම් බැඳීමක් නෑ. බැඳීමක් නැත්නම් විපාක පිණිස කර්ම සකස් වීමකුත් නෑ.

එහෙනම් ජරා, මරණ, ශෝක, වැලපීම්, සුසුම් හෙලීම් වලින් එයා නිදහස් වෙනවා. **(නාභිනන්දති, නාභිවදති, නාජ්ඣෝසාය තිට්ඨති)** සතුටින් පිළිගන්නෙ නෑ, ගුණ කියන්නෙ නෑ, ඒ තුළ හිත බැස ගන්නෙ නෑ.

**එතකොට විදර්ශනාවෙන් අපි කරන්නේ රූපයේ ඔය ස්වභාවය අවබෝධ කරන තුරු ප්‍රගුණ කිරීම යි.** එතකොට

යම් ඇල්මක් තිබුන ද රූපය කෙරෙහි, ඒ ඇල්ම නිරුද්ධ වෙලා යනවා, ඒක නොපිළිගන්න නිසා. ඒකෙ ගුණ නොකියන නිසා. එතකොට ඒක නොපිළිගන්න නම්, ගුණ නොකියන්න නම්, ඒ ගැන මොකක් ද එයාට තියෙන්න විනෙ. රූපය කියන්නෙ මෙය යි කියල රූපය ගැන පැහැදිලි අවබෝධයක් තියෙන්න විනෙ.

## වේදනාවේ නැතිවීම අවබෝධ කිරීම

Internet Version of MSP

බුදුරජාණන් වහන්සේ වදාළා වේදනාවත් මෙහෙම යි. පිළිගන්නෙ නෑ. ඇයි ඒ? අනිත්‍ය වූ ස්පර්ශයෙන් හට ගන්නා වූ වේදනාව දිය බුබුලක් බිඳි බිඳී යන්නා වගේ මේ වහ වහා නැසී යන එකක් කියල, එයා සමාධිමත් සිතින් දකිනවා. එතකොට මොකද කරන්නෙ? එයා පිළිගන්නෙ නෑ, ඒකෙ ගුණ කියන්නෙ නෑ. එතකොට ඒකෙ සිත බැසගන්නෙ නෑ. සැප විඳීම කෙරෙහි, දුක් විඳීම කෙරෙහි, උපේක්ෂා විඳීම කෙරෙහි යම් ආශාවක් තිබුන ද ඒ ආශාව නිරුද්ධ වෙලා යනව. ආශාව නිරුද්ධ වුනා නම් උපාදානත් නිරුද්ධ යි. උපාදාන නිරුද්ධ නම් භවයත් නිරුද්ධ යි.

www.gautamabuddha.org
www.mahamevna.org

## යථාර්ථය හඳුනා ගැනීම (හඳුනාගැනීමේ යථාර්ථය)

ඊළඟට බුදු රජාණන් වහන්සේ වදාළා එයා ස්පර්ශයෙන් හට ගන්නා සඤ්ඤාව පිළිගන්නෙ නෑ. මොකද හේතුව, එයා අවබෝධ කරනවා ඒක මිරිඟුවක් වගේ. මේ මතුපිටින් පේන දේට වඩා ඇත්ත මීට වඩා වෙනස් එකක්. හැබැයි ඒක නුවණින් විමසලා සිහි කරන කෙනෙක් විතරයි අවබෝධ කරන්නේ.

එතකොට සඤ්ඤාව එයා පිළිගන්නෙ නැත් නම්, ගුණ කියන්නෙත් නැත්නම්, සඤ්ඤාවෙ හිත බැස ගන්නෙ නැතිව යනවා. එතකොට මොකද වෙන්නේ? සඤ්ඤාව කෙරෙහි යම් ආශාවක් තිබුන ද, අන්න ඒක නිරුද්ධ වෙලා යනවා. ඒ ආශාව නිරුද්ධ වෙලා ගියහම උපාදානත් නැහැ. භවයත් නැහැ. ඉපදීමත් නැහැ. ජරා මරණ කිසිවක් නැහැ.

## කෙසෙල් අරටුව

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා, එයා සමාධි සිතින් සංස්කාර (චේතනාව) අවබෝධ කර ගන්නවා කියල. බුදුරජාණන් වහන්සේ වදාළෙ චේතනාව මොකක් වගේ දකින්න කියල ද? කෙසෙල් ගහක් පතුරු ගහනවා වගේ කියල. අපි සිතුවිලි සිත සිතා සිටිනව, ඒක හරියට කෙහෙල් ගහක් පතුරු ගහනව වගේ දෙයක්. ඒ තුළ කිසි ම හරයක් නැහැ.

## දිව්‍ය ලෝකෙ ගියත් හරයක් නම් නැහැ.

සංස්කාර දිව්‍ය ලෝකයේ ගියත් එච්චර තමයි. ඉතින් හරයක් හම්බවෙන්නෙ නැහැ, හරයක් හම්බවෙන්නේ ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කළොත් විතරයි. දෙවියන් අතරට ඔබ ගියත්, ඔබ මොකක් ද කරන්න විනෙ. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ම ගමන් කරන්න විනෙ. නැත්නම් දෙවියන් අතරට ගියා කියල ඔබට ලාභයක් නෑ. දෙවියන් අතර ඉඳගෙනත් ඔබ මේක ප්‍රගුණ කරන්න විනෙ. එතකොට තමයි ඔබ ආර්ය මාර්ගයේ ගමන් කරන කෙනෙක් වෙන්නේ. නියම හරය කරා යන කෙනෙක් වෙන්නෙ. නැත්නම් ඒ සංස්කාර

ඔක්කොම කෙහෙල් ගහක් පතුරු ගහනවා වගේ අන්තිමට ඒවා නැතිවෙලා ගිහිල්ලා, කර්මානුරූපව ආයේ කොහේ හරි යනවා. එහෙම තමයි අපි මේ දිගින් දිගට මේ ආවෙ.

ඉතින් මේ නිසා මේ සංස්කාර වල යථාර්ථය දකින කොට එයා පිළිගන්නෙ නැහැ. ගුණ කියන්නෙ නැහැ. එතකොට මොකද වෙන්නෙ, ඒකෙ හිත බැස ගන්නෙ නැහැ. එතකොට සංස්කාර කෙරෙහි යම් ආශාවක් තිබ්බ නම්, ඒ ආශාව නිරුද්ධ වෙලා යනවා. එතකොට උපාදාන නිරුද්ධ වෙනව. භවය නිරුද්ධ වෙනව. ජාති, ජරා, මරණ නිරුද්ධ වෙනව. එතකොට පටිච්ච සමුප්පාදය සම්පූර්ණයෙන් නිරුද්ධ වෙලා යනව. හරි විශ්මය ජනක විද්‍යාවක්. මම ඒකයි මේ විද්‍යාවට පමණක් ප්‍රශංසා කරන්නෙ. ඔය බටහිර විද්‍යාවට නම් කිසිසේත් ප්‍රශංසා කරන්න දෙයක් නෑ මට. නමුත් මේ විද්‍යාව නම් සම්පූර්ණයෙන් ම විශ්මයජනක යි. මේක ඒකාන්තයෙන් ම ප්‍රශංසා කළ යුතු ම යි.

## විඤ්ඤාණයේ ඇත්ත තත්වයත් දකිනවා

ඉතින් බුදු රජාණන් වහන්සේ වදාළා එයා විඤ්ඤාණය අවබෝධ කරනවා, එකඟ වූ සිතින් සමාධිමත් සිතින්, විඤ්ඤාණය එයා දකින්නෙ මොකක් වගේ ද? මායාවක් වගේ. විඤ්ඤාණයේ මායාව අල්ලනවා කියන එක ලේසි නෑ. පුදුම විදිහට අපි රැවටෙන්නේ. ඇයි ඒක එච්චරට ම සජීවී දෙයක්. විඤ්ඤාණය කියන්නේ මැරිච්ච එකක් නොවෙයි. ඒකනේ බුදුරජාණන් වහන්සේ බීජයකට විඤ්ඤාණය උපමා කළේ. දැන් බීජය පොළවක හිටෙව්වට පස්සෙ වතුර දැම්මට පස්සේ මොකද වෙන්නෙ පැල වෙලා හොඳට මේක වැඩෙනවා. සජීවී උපමාවක්

නේ විඤ්ඤාණයත් එහෙම යි. හොඳට බලන්න හිතලා අපිට හොයන්න බෑ. මේක හේතු ඵල දහමෙන් හට ගත්තු දෙයක් කියල. ඒ තරම් ම මේක වැඩ කරන්නේ සම්පූර්ණ කෙනෙක් ක්‍රියා කරවනව වගේ. ඒ නිසා මේ විඤ්ඤාණය අවබෝධ කරන්න ම විනෙ, මේක නාම රූප ප්‍රත්‍යයෙන් ම හට ගත්තු එකක් කියල. නාම රූප නිරුද්ධ වීමෙන් නිරුද්ධ වෙලා යන එකක් කියල. මේ විඤ්ඤාණයේ මායාකාරී ස්වභාව නිරර්ථක හිස් බවක් කියල, (හිස් කීවේ මම ය, මාගේ ය, මාගේ ආත්මය කියල ගන්න දෙයක් නැති කම) අවබෝධ වුනාට පස්සෙ විඤ්ඤාණය පිළි ගන්නෙ නෑ.

## මැරුනට පස්සේ කොයිබට යන්නේ?

දැන් දවසක් මම කල්පනා කළා විඤ්ඤාණයේ ස්වභාවය ගැන. කල්පනා කරන කොට මට පුදුම හිතුනා මිනිස් ලෝකයට ආපු එක ගැන. ඇයි ඒ විඤ්ඤාණය හැදිලා තියෙන්නෙ ම කර්මානුරූපව නරක පැත්තට යන්න යි. හැබැයි ඒ පුදුම හිතෙන හේතුව සාධාරණ යි. ඇයි බුදු රජාණන් වහන්සේ වදාළේ මිනිස් ලෝකයේ ඉපදිච්ච අය මැරුණට පස්සේ මිනිසුන් අතරට ආයෙමත් එන්නේ නියපොත්තට ගත්තු පස් චුට්ටක් වගේ ප්‍රමාණයක්. මහ පොළොව තරම් ප්‍රමාණයක් යන්නෙ ම සතර අපායේ. ඉතින් ඒක පිළිගන්න වෙනවා. ඉතා ප්‍රබල ලෙස අපට සාධක තිබෙනවා. අපි ඒ ගැන බලවත් ව ශ්‍රද්ධාව ඇති කර ගෙන තිබෙනවා, ඒක ඇත්ත ම යි කියල.

මැරුණු අය ගැන අපිට ආරංචි ලැබෙන්නෙ ම එක්කො මළ යක්කු වෙලා, එක්කෝ භූතයෝ වෙලා, එක්කෝ පෙරේතයෝ වෙලා, කුම්භාණ්ඩයෝ වෙලා,

ඔන්න ආරංචි වෙනවා, මිනිස් ලෝකෙන් ගිහිල්ලා කරගෙන තියෙන දේ. විඤ්ඤාණය මේ විදිහට හැදෙනවා කියලා එයා දන්නෙ නෑ. ඒකයි එබඳු විපතක් කරා යන්නට හේතුව. ඇයි බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය හොඳට අහල යෝනිසෝ මනසිකාරයේ යෙදිල මේක අවබෝධ කරලා නෑ නෙව.

## සාදරයෙන් 'නො' පිළිගනිමු - විඤ්ඤාණය

Internet Version of MSP

ඉතින් බුදුරජාණන් වහන්සේ වදාළා විඤ්ඤාණය එයා පිළින්නෙ නෑ. විඤ්ඤාණයේ ගුණ කියන්නෙ නෑ. එතකොට මොකද වෙන්නෙ? විඤ්ඤාණයේ සිත බැසගන්නෙ නැතිව යනවා. එතකොට විඤ්ඤාණය කෙරෙහි යම් ආශාවක් තිබුනා නම්, ඒ ආශාව නිරුද්ධ වෙලා යනවා. ඒ ආශාව නිරුද්ධ වුනා නම්, උපාදාන නිරුද්ධ වෙනවා. උපාදාන නිරුද්ධ වුනා නම්, භවය නිරුද්ධ වෙනවා. භවය නිරුද්ධ වුනා නම්, ආයෙ උපතක් කරා එන්නෙ නෑ. ඉපදීම නිරුද්ධ වුන නිසා ජරා, මරණ ආදී සියව් දුක් නිමා වෙනවා.

www.gautamabuddha.org

## හටගැනීමත් නැතිවීමත් මෙහෙම දකිමු

www.mahamevna.org

දැන් අපට එහෙනම් එකක් පැහැදිලි යි. මොකක් ද? බුදුරාණන් වහන්සේ මේ සමාහිත සිත් ඇති කර ගන්න කීවෙ පංච උපාදාන ස්කන්ධයේ හට ගැනීමත් නැති වීමත් අවබෝධ කිරීමට යි. දැන් අපි මේකේ රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ කියන පංච උපාදාන ස්කන්ධ ඉගෙන ගත්තා. **(අභිනන්දති)** ඒවා සතුටින් පිළිගන්නවා. **(අභිවදති)** ගුණ කියනවා. **(අජ්ඣෝසාය තිට්ඨති)** බැස ගන්නවා. ඒ මොනව ද පිළිගන්නේ? පංච උපාදාන

ස්කන්ධය. මොනවාගේ ද ගුණ කියන්නෙ? පංච උපාදාන ස්කන්ධයේ. මොකක ද බැස ගන්නේ? ඒත් පංච උපාදාන ස්කන්ධයේ ම යි.

## වර්ණනා කළ දුක

පංච උපාදාන ස්කන්ධය කියන්නෙ මොකක් ද? දුක. එහෙම නම් එයා සතුටින් පිළිගත්තෙ මොකක් ද? දුක. ගුණ වර්ණනා කළේ මොකේ ද? දුකේ. බැස ගත්තෙ මොකක ද? දුකේ. බැසගත්තට පස්සේ ආශාව ඉපදුනා. ආශාව ඉපදුනේ මොකේට ද? දුකට. ඊට පස්සෙ මොක ද වුනේ? බැඳුනා. බැඳුනෙ මොකේට ද? දුකට. ඊට පස්සෙ උපතක් කරා යන්නෙ කොහේ ද? දුක කරා.

බුදු රජාණන් වහන්සේ වදාළා මෙයා පංච උපාදාන ස්කන්ධයේ ඇත්ත තත්වය අවබෝධ කළා ම පංච උපාදාන ස්කන්ධය පිළිගන්නෙ නෑ. එතකොට මොකක් ද එයා පිළිගන්නෙ නැත්තෙ? දුක පිළිගන්නෙ නැත්තෙ. එයා දුක වර්ණනා කරන්නෙ නෑ. එතකොට එයාගේ හිත පංච උපාදාන ස්කන්ධයේ බැස ගන්නෙ නෑ. ඒ කියන්නෙ දුකේ හිත බැස ගන්නෙ නෑ. එතකොට එයා පංච උපාදාන ස්කන්ධයේ බැස ගන්නේ නැති නිසා ඒ කෙරෙහි යම් ආශාවක් තිබ්බා නම් ඒක නිරුද්ධ වෙනවා. මොකක් කෙරෙහි තිබුන ආශාව ද නිරුද්ධ වෙන්නේ? දුක කෙරෙහි තිබුන ආශාව යි නිරුද්ධ වෙන්නේ. නිරුද්ධ වෙච්ච ගමන් ඒ බන්ධනය නිරුද්ධ වෙනවා. එහෙම නම් දුකට බැඳෙන්නෙ නෑ. එයා දුකට බැඳෙන්නෙ නැත්නම්, දුක කරා යන්නෙත් නෑ. එයා දුකෙන් නිදහස් වෙනවා. ඒක තමයි ආර්ය විමුක්තිය.

Internet Version of MSP www.gautamabuddha.org www.mahamevna.org

## මමත් සිත සමාහිත කරමි බුදු සමිඳුනේ...

දැන් බලන්න බුදු රජාණන් වහන්සේ ගේ දේශනාවල්. ඉස්සරවෙලා ම එයා මොකක් ද කරන්න චනෙ. සීල සංවරයට පැමිණෙනවා. පැමිණිලා ඉන්ද්‍රිය සංවරය ඇති කරගෙන, ඊළඟට මේ හැම ඉරියව්වක ම සිහිය පවත්වා ගෙන සමාධිය දියුණු කරනවා. එතකොට ඒක චතුරාර්ය සත්‍යය අවබෝධය ඉලක්ක කරපු එකක්. ආර්ය සමාධිය, සම්මා දිට්ඨිය තියෙන කෙනාට පුළුවන් මේක බොහොම ලස්සට නිරවුල් කර ගන්න.

## සොඳුරු ගමනක් යන්න මෙන්න මාවත

ඊට පස්සෙ එයා ආර්ය සමාධිය තුළ තවදුරටත් දියුණු කරන්නෙ මොනව ද? චතුරාර්ය සත්‍ය අවබෝධ කරන එක ම යි. ඒක නේද මේ කතා කළේ? ප්‍රඥව හැටියට පංච උපාදානස්කන්ධ දුක මේ අපි කතා කළේ. එහෙනම් එයා අවබෝධ කර ගත්ත නම්, මේක දුක ආර්ය සත්‍යයක්, මේ තණ්හාව ආර්ය සත්‍යයක, මේකෙන් තමයි ගෙනියන්නේ, ඉස්සරහට තල්ව් කර කර. තණ්හාව නැත්නම් දුකෙන් නිදහස්. ඒ තණ්හාව නැතිවීම ආර්ය සත්‍යයක්. මේකෙන් නිදහස් වීම සඳහා මේක තමයි තිබෙන වැඩ පිළිවෙල,ආර්ය ශීල, ආර්ය සමාධි, ආර්ය ප්‍රඥව. ඒ ප්‍රතිපදාවත් ආර්ය සත්‍යයක්.

දැන් මේ විදිහට පංච උපාදාන ස්කන්ධයේ ඇති වීමත්, නැති වීමත් අවබෝධ කරන කොට එයා තුළ ගොඩනැගෙන ප්‍රඥව මොකක් ද? ආර්ය ප්‍රඥව. ඊළඟට පංච උපාදාන ස්කන්ධය නැති වීම සාක්ෂාත් කරන කොට එයා තණ්හාවෙන් නිදහස් වෙනවා. ආර්ය විමුක්තිය. එතකොට එයා දුකෙන් නිදහස්. එතකොට ආර්ය සීල, ආර්ය සමාධි, ආර්ය ප්‍රඥා, ආර්ය විමුක්ති

කියන මේ කරුණු ටික අපි හොඳට බුද්ධියෙන්, කල්පනාවෙන්, කැපවීමෙන්, වීර්යයෙන් දියුණු කරනවා නම් මේ කරා යන්නට අපට බැරි වෙන්නෙ නෑ.

## ආර්ය අෂ්ටාංගික මාර්ගය ද? හිත ද?

හැබැයි අපට මේ සඳහා උවමනා කරනවා ඉලක්කයට යාම පිණිස දශමයෙන් දශමය හරි අපි සකස් වෙන්න ඕනෙ, ආර්ය මාර්ගයට. දවසක් පුතෙක් ඇවිල්ල කිව්වා මම මේ ධර්ම මාර්ගයට පැමිණෙනවා. මට හිත විශ්වාස යි. මං කිව්වා පුතා නරක දේනේ විශ්වාස කළේ. මොකද මේ හිත විතරක් විශ්වාස කරන්න එපා කියල. මේ හොඳට තියෙන හිත නොමග යන තැන තමන්වත් දන්නෙ නෑ. හිත නෙමෙයි විශ්වාස කරන්න ඕනෙ. ආර්ය අෂ්ඨාංගික මාර්ගය යි. ආර්ය අෂ්ඨාංගික මාර්ගය විශ්වාස කරගෙන ආර්ය අෂ්ඨාංගික මාර්ගය ම යි සම්පූර්ණ කරන්න ඕනෙ.

මං උපමාවක් කිව්වා. කෙනෙකුට ඕනෙ මුහුදට යන්න. හැබැයි එයාට වෙන පාරක් නෑ. හැබැයි ගංගාවක් තියෙනවා. ඒක තියෙන්නෙ කෙලින් ම මුහුද කරා යන්න. එතකොට එයා මොක ද කරන්න ඕනෙ. ගඟට පනින්න ඕනෙ. එතකොට මොකද වෙන්නෙ? කෙලින් ම මුහුදෙ. ඒකට හේතුව මොකක් ද? ගඟ යන්නේ මුහුදට. මේ වගේ කෙනෙකුට ඕනෙ විමුක්තිය නම්, ඒ විමුක්තිය ඕනෙ කෙනා මොකද කරන්න ඕනෙ? ආර්ය අෂ්ඨාංගික මාර්ගයට පනින්න ඕනෙ. එතකොට ඒ ආර්ය අෂ්ඨාංගික මාර්ගය විසින් එයාව නිවන කරා එක්කන් යනවා. මේක තමයි මේ ධර්මයේ බොහොම පැහැදිලිව තේරුම් ගත යුතු දේ.

## "පින්වත් එතෙර, මෙතෙරට පැමිණෙත්වා"

බුදුරජාණන් වහන්සේ පැහැදිලිව පෙන්වල දීල

තියෙනව, ඔන්න ගංහාවක් තියෙනවා. ලොකු, පළල් ගංහාවක්. දැන් මේ ගංහාවෙන් එතෙර වෙන්න පාලමක් නෑ. බෝට්ටු, නැව් සේවයක්, ඔරු පාරු සේවයක් නෑ. දැන් ගංගාවෙන් එතෙර වෙන්නත් විනෙ. මෙතෙර භයානක යි. දැන් එයා ගං තෙරේ ඉඳලා ගඟ දිහා බලාගෙන මෙතෙර ඉඳන් වැඳ ගන්නවා. වැඳගෙන මොකද කරන්නේ, අර එතෙර දිහා බලාගෙන කියනවා "පින්වත් එතෙර, මෙතෙරට පැමිණෙත්වා" පැමිණෙයි ද? ඒ මොකද හේතුව. එහෙම එකක් නෑ. ලංකාවේ මිනිස්සුන්ගේ නිවන් පැතිල්ලත් අන්න ඒ වගේ එකක්.

දැන් ගඟෙන් එතෙරවෙන්න පාලමක් නෑ. බෝට්ටු සේවයක් නෑ. ඔරු පාරු සේවයක් නෑ. දැන් මොකද කරන්නෙ? ලී දඬු කෑලි හොයල, ශක්ති සම්පන්න පහුරක් හදා ගන්නවා. හදාගෙන ඒ පහුර වතුරට දාලා වීරියෙන් ම ඒ පහුර අරගෙන යන්න විනෙ. එහෙනම් පහුර අරගෙන යන්න තියෙන්නෙ අතේ පයේ වීරියෙන් ම යි. එතකොට එයාට ගංගාවෙන් එතෙර වෙන්න පුළුවන් වෙනවා. මෙන්න මේ වගේ තමයි, බුදු රජාණන් වහන්සේගේ ධර්මයෙන් එතෙරට යන්නෙ ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් ම යි.

ආර්ය අෂ්ඨාංගික මාර්ගය නමැති පහුරෙන්, කාමය කියන ගංහාව එයා තරණය කරනවා, වීරියෙන්. ආයෙ එයා උපතක් කරා යාම කියන වේගවත් සැඩ පහර සහිත ගංහාව තරණය කරනවා. අවිද්‍යාව කියන ගංහාව තරණය කරනවා. එයා අමා මහ නිවන කියන දූපතට ගොඩ වෙනවා. එයා සංසාරෙන් අත්මිදෙනවා. මේ සියවි දෙනාටත් මේ ශ්‍රී සද්ධර්මය පිහිට කරගෙන මේ ගෞතම බුද්ධ ශාසනයේ දී ම උතුම් නිවන් අවබෝධ වේවා.

**සාදු! සාදු!! සාදු!!!**

Internet Version of MSP www.gautamabuddha.org www.mahamevna.org

# සත්ත සුරියුග්ගමන සූත්‍රය

## (ඉර වල් හතක් උදාවීම ගැන වදාළ දෙසුම)

*අංගුත්තර නිකාය 3 (සළායතන වර්ගය)*

Internet Version of MSP
www.gautamabuddha.org
www.mahamevna.org

# සත්ත සුරියුග්ගමන සූත්‍රය

නමස්කාර වේවා! බුදු රුවනට සැම දා! බුදු හිමි සරණ යමි
නමස්කාර වේවා! දම් රුවනට සැම දා! සඳහම් සරණ යමි
නමස්කාර වේවා! සඟ රුවනට සැම දා! මහ සඟ සරණ යමි
නමස්කාර වේවා! තුනුරුවනට සැම දා! තිසරණ සරණ යමි

ශ්‍රද්ධාවන්ත පින්වතුනි,

සංසාරයේ නොයෙක් ආත්ම භාව වල ඉපිද ඉපිද අපි ආපු ගමනක් මේ තියෙන්නෙ. මේ යන සංසාර ගමනේ දි දැන් අපට මිනිස් ලෝකෙ උපතක් ලැබිල තියෙනවා. මිනිස් ලෝකෙ උපතක් ලැබුනට අපට සාර්ථක මනුස්ස ජීවිතය කියන කරුණ දැනගන්න ක්‍රමයක් තිබුනෙ නෑ. සාර්ථක මිනිස් ජීවිතයක් අත්කරලා දෙන්න අපේ දෙමව්පියෝ අපිව ඉස්කෝලෙ ඇරියා, අපිට බල කළා, ඉගෙන ගන්න කියල. අපි ඉගෙන ගත්තා. තරුණ වයස වෙනකොට රස්සාවක් හොයන්න අපි පෙළඹුනා. ඊට පස්සෙ විවාහ වෙනවා, ගෙවල් දොරවල් හදාගන්නවා, ජීවිතය ගෙවනවා. මේක තමයි ලෝකෙ සාර්ථකයි කියල පිළිගත්තු එක.

## හරි හම්බ කරපු දේවල් දුක් මහන්සියෙන්....

ඔය ජීවිතය ගෙවලා කෙනෙකු මළාට පස්සෙ අපේ සමාජය කියනවා එයාට, එයා සාර්ථක ජීවිතයක් ගෙව්වා කියල. එයා දියුණු වුනා කියල. කවුරු හරි කෙනෙක් ඉඩ කඩම් දේපල වස්තු උපයාගෙන සිටිනවා නම් අපි එයාට කියනවා අන්න එයා දැන් හරි දියුණුයි කියල. එතකොට

අපි හැම තිස්සෙ ම පුද්ගලයෙකුගේ දියුණුව මැන්නේ එයා හම්බ කරන දේවල් වලින්. හම්බ කිරීමෙදි කොච්චර ධාර්මික ද කියල අපි දන්නෙ නෑ. කොයිතරම් සාධාරණ ද කියල දන්නෙ නෑ. එයා රැස් කරන දේවල් බලලා අපි උජාරුවට කියනවා අන්න දැන් දියුණු යි කියලා.

## සංවර වූ කය

බුදුරජාණන් වහන්සේ මේ දියුණුව ගැන සැලකුවේ මෙහෙමයි. යම් කිසි ආර්ථික දියුණුවක් ඇද්ද, එය ඉතා ම අල්ප දෙයක්. දැන් අපි ඇමරිකාව වගේ රටවල් වලට කියනවා දියුණු යි කියල. බුදුරජාණන් වහන්සේ වදාළා ඒක ඉතා ම අල්ප දෙයක්. මහත් ම දියුණුව, ප්‍රඥාව දියුණු කර ගැනීම යි. මේ ප්‍රඥාව දියුණු කර ගන්න කොට අපි දියුණු කරගන්නවා කරුණු තුනක්.

අපි දියුණු කරගන්නවා කය. යමෙක් කයෙන් ප්‍රාණඝාත කරන්නේ නැත්නම් එයා කය දියුණු කරපු කෙනෙක්. යමෙක් කය පාවිච්චි කරලා කුඩා දෙයක් වත් සොරකම් කරන්නේ නැත්නම් කය දියුණු කරපු කෙනෙක්. අපිට මේවා අවතෙන් ම කරන්න වෙලා තියෙනවා. මොකද කය දියුණු කරපු අය බොහොම අඩු යි. කය පාවිච්චි කරලා වැරදි කාම සේවනය කරන්නේ නැත්නම් කය දියුණු කරපු කෙනෙක් එයා. කය පාවිච්චි කරලා මත් පැන්, බීඩියක්, සුරුට්ටුවක් වත් බොන්නේ නැත්නම් කය දියුණු කරපු කෙනෙක් එයා. මේ කරුණු වලින් වැලකී සිටිනවා කියන්නෙ එයා දියුණු කයක් පාවිච්චි කරනවා.

## කටේ කෙටේරියක් ද?

යම්කිසි කෙනෙක් අභූත, අසත්‍ය, බොරු කියන්නේ නැත්නම් එයා වචනය දියුණු කරපු කෙනෙක්. කේලාම්

කියන්නෙ නැත්නම් එයා වචනය දියුණු කරපු කෙනෙක්. එරුස වචන කියන්නෙ නැත්නම් එයා වචනය දියුණු කරපු කෙනෙක්. අර්ථ ශූන්‍ය, හිස්, බොළඳ කතා කියව කියව ඉන්නෙ නැත්නම් වචනය දියුණු කරපු කෙනෙක්. අන්න ඒක බුදුරජාණන් වහන්සේ දියුණුව හැටියට සලකන දේ.

## හිත හීලෑ නෑ හරි ම මුරණ්ඩුයි....

ඒ වගේ ම කෙනෙක් මේ ලෝකෙ බාහිර දේවල් බලලා අනුන්ගේ දේට ආස කරන්නේ නැතිනම්, ඊර්ෂ්‍යා කරන්නේ නැත්නම්, සිත දියුණු යි. ක්‍රෝධ කරන්නේ නැත්නම් සිත දියුණු යි. පළිගන්නේ නැත්නම් සිත දියුණු යි. බද්ධ වෛරය නැත්නම් සිත දියුණු යි. එකට එක කිරීම නැත්නම් සිත දියුණු යි. අකීකරු කම ඒ කියන්නේ ධර්මානුකූල අදහසට එකඟ නැති කම නැත්නම් සිත දියුණු යි. මුලාව නැත්නම් සිත දියුණු යි. බුදුරජාණන් වහන්සේ පෙන්වා දෙනවා මේ දියුණුව ලබා ගන්නේ ප්‍රඥාවන්ත කෙනෙක්. අන්න ඒ දියුණුව තමයි මේ ලෝකේ සැබෑ ම දියුණුව. ඒ දියුණුව කරා යන්නේ ප්‍රඥාවන්ත පිරිස යි. ඒක ලබාගන්නේ තම තමන් විසින් තම තමන් තුළ ධර්මය ගොඩ නැගීමෙන් විතර යි. වෙන කිසි ම ක්‍රමයකට ඒක ලබා ගන්න බෑ.

## අත්වැල් බැඳ ලබන අවබෝධය...

අපි කියමු භාවනා කරන පිරිසක් ඉන්නවා. ඒ අය ළඟට එනවා හොරකම් කරන කෙනෙක්. එයා අර පිරිසේ වාඩිවෙලා හිටියට, ඒ පිරිසට අයිති නෑ. අන්න ඒ වගේ තම තමන් විසින් තම තමන් තුළ ධර්මය ගොඩනගා ගන්න කොට තමයි, ධර්මයේ සැබෑ ම හිමිකාරයා බවට

පත් වෙන්නේ. එහෙම නැතුව පිරිසක් එකතු වූ පමණින්, අපිත් ඒ පිරිසට එකතු වූ පමණින් අපි ඒ පිරිසේ කොටස් කාරයෝ බවට පත් වෙන්නෙ නෑ. දේශපාලනයට නම් එහෙම වෙයි. නමුත් ධර්මයට එහෙම වෙන්නෙ නෑ. ධර්මය වෙනස් එකක්. ධර්මයේ තිබෙනවා ගුණයක්, **පච්චත්තබ්බං වේදිතබ්බෝ විඤ්ඤූහී** කියල. ඒ කියන්නේ බුද්ධිමත් උදවිය විසින් වෙන් වෙන් වශයෙන් අවබෝධ කරන්න ඕනෙ. මං ඒකට ඔබට තේරුම් ගන්න උපමාවක් කියන්නම්.

## සෙල්ලම් ගෙවල්...

අපි කියමු මෙතන ඉන්නවා කියල පන්දාහක්. අපි ඔක්කොට ම ලැබිලා තියෙනවා, පොඩි පොඩි ඉඩම් කෑලි. හැබැයි ගෙයක් නෑ. ඉඩම විතරක් තියෙනවා. ගෙයක් නැතිව ඉඩම විතරක් තියෙනවා නම් එයා ස්වාභාවික විපත් වලට මුහුණ දෙන්න ඕනෙ. වැස්සට මුහුණ දෙන්න ඕනෙ. අව්වට වේලෙන්න ඕනෙ. පිණිබාන්න ඕනෙ. මෙයා ගේ හදාගන්න දන්නෙත් නැති කෙනෙක්. හැබැයි ඉඩම් කෑල්ල විතරක් තියෙනවා. එතකොට කරුණාවන්ත කෙනෙක් ඇවිත් එයාට මෙහෙම කියනවා. ගේ හදන්න බඩු මුට්ටු ඔක්කොම දෙනවා. ගල්, වැලි, සිමෙන්ති ඔක්කොම දෙනවා. ගේ හදන්න වුවමනා කරන ක්‍රමය කියලා දෙනවා. ගේ හදන හැටි, ගඩොල් මෙහෙම යි තියෙන්නේ. මේ තැන් වල යි කණු ගහන්නේ. ගෙට ප්ලෑන් එකත් දෙනවා.

දැන් එක එක්කෙනාට හම්බ වෙනවා ඒක. කෙනෙක්ට බඩු මුට්ටු ටික ඔක්කොම හම්බ වෙනවා. ප්ලෑන් එකත් හම්බ වෙනවා. නමුත් මෙයා බඩු ටික



Internet Version of MSP www.gautamabuddha.org www.mahamevna.org

තියාගෙන ඉන්නවා. ගේ හදන්නේ නැතිව. ගේ හදන්නේ නැති නිසා එයාට අර ස්වාභාවික විපත් වලින්, සතුරු කරදර වලින් නිදහස් වෙලා ද ඉන්නේ? නෑ. ගේ හදන හැටි මම දන්නවා කිය කිය කයිවාරු ගැහුවට එයා ගේ හදාගෙන නෑ. මට බඩු මුට්ටු ඔක්කොම තියෙනවා කිව්වට ගේ හදාගෙන නෑ.

## සිහින මාලිගාව...

Internet Version of MSP

තව කෙනෙක් ඉන්න පුළුවන් එයාට බඩු මුට්ටු ඔක්කොම තියෙනවා. එයාත් ගේ හදාගෙන ඉන්නෙ කියල පෙන්නන්න අට්ටාලයක් ගහගෙන ඉන්නවා. හැබැයි ඒ අට්ටාලෙ හයිය නෑ. විනෙ වෙලාවක ඒ අට්ටාලෙ සුළඟට, ලොකු විපතකට කඩා වැටෙන්න පුළුවනි. තව කෙනෙක් ඉන්නවා උත්සාහයෙන්, වීර්යයෙන් ගේ හදා ගන්නවා. තමන්ගේ ගේ ප්‍රමාණය හඳුනාගෙන උවමනා කරන විදිහට අත්තිවාරම් කපාගෙන ගේ හදාගෙන ඉන්නවා. තව කෙනෙක් ඉන්නවා, ගේ හදන්න විනෙ බඩු දාලා දාලා විශාල අත්තිවාරමක් දාගන්නවා, මේ සම්මජ්ජාතියෙ හදන්න බැරි විදිහට.

www.gautamabuddha.org www.mahamevna.org

## වෙන කවුරුත් නැත අද මා පමණයි...

අපේ මනුස්ස ජීවිතය, අපිට ලැබිච්ච ඉඩම් කට්ටිය වගේ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය ගේ හදන්න ලැබිච්ච ගඩොල්, සිමෙන්ති, වැලි ආදිය යි. ධර්ම මාර්ගයේ යන්න තියෙන විනය ගේ හදන ක්‍රමය වගෙයි. ඉතින් එක්කෙනෙක් දෙන්නෙක් ඔය ගේ හදාගන්නවා. අනිත් අය වැලි, සිමෙන්ති ගොඩ ගහගෙන ඔහේ ඉඩම් කෑල්ලට වෙලා ඉන්නවා. මෙහෙම තමයි, මට පේන මේ බෞද්ධ

ලෝකය. ඉතින් ඒ නිසා අපි බුදු රජාණන් වහන්සේ ගේ දහම තුළින් ඉස්සෙල්ලා ම තමා විසින් තමා ව ගොඩ නගා ගන්න විනෙ. අන්න ඒ කරුණු බුදු රජාණන් වහන්සේ ගේ ධර්මයෙන් විතරයි අපිට ලැබෙන්නෙ. මම ඒකයි කිව්වෙ බුද්ධිමත් කෙනා වෙන් වෙන් වශයෙන් අවබෝධ කරනවා කියල. එක රංචුවට අවබෝධ කරනවා නෙවෙයි. අපි හිතමු පන්සියයක් සමාධිය වඩනවා, එකතු වෙලා. ඒත් වෙන් වෙන් වශයෙන් තමයි කරන්න තියෙන්නෙ. එහෙම නම් මේක තම තමන් විසින් තම තමන් ගැන වග බලා ගත යුතු කරුණක්.

## ඉරවල් හතක් පායලා...

ඉතින් බුදුරජාණන් වහන්සේ නිරන්තරයෙන් ම අපිට දේශනා කළා, මේ ලෝකයේ තියෙන්නේ අනිත්‍ය දේවල්. ඒ අනිත්‍ය දේවල් ගැන බුදුරජාණන් වහන්සේ ගේ අවබෝධය කොයිතරම් පළල් ද කියලා බලන්න.

මේ දේශනාවේ නම ඉර වල් හතක් උදාවීම ගැන වදාළ දෙසුම. **සත්ත සූරියුග්ගමන සූත්‍රය.** මේ දේශනාව බුදුරජාණන් වහන්සේ වදාළෙ විශාලා මහනුවර අම්බපාලී වනයේ දී. රැස්වුන භික්ෂු සංඝයාට බුදු රජාණන් වහන්සේ මෙහෙම වදාළා,

## අනිච්චා වත සංඛාරා !

**(අනිච්චා භික්ඛවේ, සංඛාරා)** එතන සංඛාර කිව්වෙ හේතු ඵල දහමින් හටගත්තු සියව් දේට. "මහණෙනි, මේ සංස්කාර අනිත්‍ය යි" **(අද්ධුවා භික්ඛවේ, සංඛාරා)** "මහණෙනි, හේතු ඵලයන් ගෙන් හටගත්ත සියව්

දේ ම අස්ථිරයි.” **(අනස්සාසිකා භික්ඛවේ, සංඛාරා)** “මහණෙනි, හේතු ඵලයන් ගෙන් හට ගත්ත දේ අස්වැසිලි රහිත යි.” **(යාවඤ්චිදං භික්ඛවේ, අලමේව සබ්බසංඛාරේසු නිබ්බින්දිතුං)** “මහණෙනි, එම නිසා හේතු ඵලයන් ගෙන් හටගත්ත සියළු දෙය ගැන ම අවබෝධයෙන් ම කළකිරෙන්න ම යි වටින්නෙ.” **(අලං විරජ්ජිතුං)** “අවබෝධයෙන් ම නො ඇලෙන්න ම යි වටින්නෙ.” **(අලං විමුච්චිතුං)** “අවබෝධයෙන් ම නිදහස් වෙන්න ම යි වටින්නෙ.”

මනුෂ්‍යයන් හැටියට බුදුරජාණන් වහන්සේ ගේ මේ පණිවිඩය අපි හරියට අල්ලගෙන හිටියා නම්, අපි කවුරුවත් හිස් අතින් මැරෙන්නෙ නෑ. මේ පණිවිඩය අල්ලගන්නට බැරි වීම නිසා අනිත්‍ය දේවල් ම ගොඩ ගහගෙන, අනිත්‍ය දේවල් ම සතුටින් පිළිඅරගෙන, ඒ තුළ ම අපේක්ෂා සහිතව ඉඳලා අස්වැසිලි රහිතව ම මැරිලා යනවා. බුදුරජාණන් වහන්සේ මේ අනිත්‍යය දර්ශනය ඉහළින් ම අපට දේශනා කරන ආකාරය බලන්න.

## වැස්ස නැති කාලයක් එනවා...

පින්වත් මහණෙනි, සිනේරු පර්වත රාජයා යොදුන් 40,000 ක් දිග යි. යොදුන් 40,000 ක් පළල යි. මේ පර්වත රාජයා ගේ යොදුන් 40,000 ක් මහා සාගරයට යටවෙලා තියෙනවා. යොදුන් 40,000 ක් සාගරයෙන් උඩට ඇවිත් තියෙනවා. හැබැයි, පින්වත් මහණෙනි, අවුරුදු ලක්ෂ ගණනක් වැස්ස නැති කාලයක් එනවා. අන්න ඒ කාලෙදි වැස්ස නැති නිසා මේ ලෝකයේ යම් තාක් ගස්, වැල්, තෘණ ආදිය ඇද්ද ඒ සියල්ල ම මැරිලා යනවා. මහණෙනි, ඔය වගේ තමයි සංස්කාර. සියළු

සංස්කාර අනිත්‍ය යි, ස්ථිර නෑ, අස්වැසිලි රහිත යි. ඒ නිසා මහණෙනි, මේ ගැන අවබෝධයෙන් ම කළකිරෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නො ඇලෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නිදහස් වෙන්න යි වටින්නෙ.

## දෙවෙනි හිරු පායන කොට...

මහණෙනි, තව කාලයක් යන කොට මේ සූර්යයාට අමතරව තව ඉරක් මේ ලෝකයට උදාවෙනවා. අන්න ඒ දෙවෙනි සූර්යයා ලෝකයට උදා වෙද්දී, පොඩි පොඩි වැව්, පොකුණු, ජල තටාක ආදිය කෙමෙන් කෙමෙන් සිඳිලා යනවා. ඒ සෑම දෙයක් ම සිඳී ගිහින් වතුර නැති වෙලා යනවා. මහණෙනි, ඔය වගේ තමයි සංස්කාර. සියව් සංස්කාර අනිත්‍ය යි, ස්ථිර නෑ, අස්වැසිලි රහිත යි. ඒ නිසා මහණෙනි, මේ ගැන අවබෝධයෙන් ම කළකිරෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නො ඇලෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නිදහස් වෙන්න යි වටින්නෙ.

## තුන්වෙනි හිරු

මහණෙනි, කාලයක් යන කොට මේ සූර්යයන් දෙදෙනාට අමතරව තවත් ඉරක් පායනවා. එතකොට ඉරවල් තුන යි. තුන් වෙනි ඉර පායන්න පටන් ගන්න කොට මේ ලෝකයේ තිබෙන මහා ගංගාවල් සිඳී යන්න පටන් ගන්නවා. ගංගා, යමුනා, අචිරවතී, මහී, සරභූ ආදී මහා ගංගා සියල්ල සිඳී ගෙන යන්න පටන් ගන්නවා. ඊට පස්සෙ මහා ගංගා ලෝකේ නැති වී යනවා. මහණෙනි, ඔය වගේ තමයි සංස්කාර. සියව් සංස්කාර අනිත්‍ය යි, ස්ථිර නෑ, අස්වැසිලි රහිත යි. ඒ නිසා මහණෙනි, මේ ගැන අවබෝධයෙන් ම කළකිරෙන්න යි වටින්නෙ.

අවබෝධයෙන් ම නො ඇලෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නිදහස් වෙන්න යි වටින්නෙ.

## හතරවෙනි ඉරත් පායලා...

පින්වත් මහණෙනි, තවත් කාලයක් ගියා ම හතරවෙනි සූර්යයා මේ ලෝකයට පායන්න පටන් ගන්නවා. හතරවෙනි සූර්යයා පායන විට අර මහා ගංගා ඇතිවෙන්න මුල් වෙච්ච මහා විල් තියෙනවා, මේ හිම කඳු අතරේ. ඒ විල් සියල්ල ම හිඳීගෙන යනවා. අනෝතත්ත විල, සීහපපාත විල, රථකාර විල, කණ්ණ මුණ්ඩ විල, කුණාල විල, ඡද්දන්ත විල, මන්දාකිණී විල. මේ සියව් විල් සම්පූර්ණයෙන් ම සිඳිලා යනවා. එතකොට පින්වතුනි, හතරවෙනි සූර්යයා පායන විට මේ මහා පෘතුවියේ ජලය නෑ. සියල්ල සිඳිල ගිහින් ඉවරයි. මහණෙනි, ඔය වගේ තමයි සංස්කාර. සියව් සංස්කාර අනිත්‍ය යි, ස්ථිර නෑ, අස්වැසිලි රහිත යි. ඒ නිසා මහණෙනි, මේ ගැන අවබෝධයෙන් ම කළකිරෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නො ඇලෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නිදහස් වෙන්න යි වටින්නෙ.

## තරු පහ නෙවෙයි හිරු පහක්...

මහණෙනි, කාලයක් යන විට පස් වෙනි සූර්යයා පායනවා. පස්වෙනි සූර්යයා ලෝකයට උදාවෙන්න පටන් ගන්න විට මහා සාගරය සිඳෙන්න පටන් ගන්නවා. මහා සාගරය කෙමෙන් කෙමෙන් යොදුන් ගණන් සිඳීගෙන යනවා. කෙමෙන් කෙමෙන් සිඳීගෙන ගිහිල්ල මනුෂ්‍යයෙකු පොහවන තරමට සිඳී ගිහිල්ලා තවත් සිඳෙනවා. අන්තිමේ දි වැස්ස වෙලාවට මඩ සහිත පොළවේ හරකෙකු ගමන් කළොත් ඒ හරකාගේ කුරයට පොළව එරෙනවා.

එතකොට ඒ කුරේ හැඩයට පොළොවේ පුංචි වලක් හිටිනවා. ඒකෙ වතුර චුට්ටක් තියෙනවා. අන්න ඒ වගේ මහා සාගරයේ ජලය ගව කුරෙන් හැරුණ වලක ජලය ස්වල්පයක් තියෙන්නේ යම් ආකාරයෙන් ද, ඒ වගේ වෙනවා. අන්තිමේ දි ඒකත් සිඳිල ගිහින් ඇඟිල්ලේ ගාගන්න වත් වතුර ටිකක් නැතිවෙනවා. පස්වෙනි සූර්යයා පායන විට පෘතුවියේ වතුර සියල්ල ම සිඳිලා යනවා. දිය බිඳක් වත් සොයාගන්න නැතිව යනවා. මහණෙනි, ඔය වගේ තමයි සංස්කාර. සියවි සංස්කාර අනිත්‍ය යි, ස්ථිර නෑ, අස්වැසිලි රහිත යි. ඒ නිසා මහණෙනි, මේ ගැන අවබෝධයෙන් ම කළකිරෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නො ඇලෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නිදහස් වෙන්න යි වටින්නෙ.

## හයවෙනි ඉරත් පායලා...

මහණෙනි, තව කාලයක් යන විට මේ ඉරවල් පහක් පායලා තියෙද්දි, හය වෙනි ඉර උදාවෙනවා. හය වෙනි සූර්යයා පායන විට මේ සිනේරු පර්වත රාජයා, මේ මහා පෘථිවිය දුම් දමන්නට පටන් ගන්නවා. හාත්පසින් දුම් දමන්නට පටන් ගන්නවා. යමක් රත් වෙද්දි දුම් දමන්නේ යම් සේද, ඒ වගේ ම හාත්පසින් දුම් දමන්නට පටන් ගන්නවා. මහණෙනි, ඔය වගේ තමයි සංස්කාර. සියවි සංස්කාර අනිත්‍ය යි, ස්ථිර නෑ, අස්වැසිලි රහිත යි. ඒ නිසා මහණෙනි, මේ ගැන අවබෝධයෙන් ම කළකිරෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නො ඇලෙන්න යි වටින්නෙ. අවබෝධයෙන් ම නිදහස් වෙන්න යි වටින්නෙ.

## අන්තිම හිරු

මහණෙනි, මේ සූර්යයන් හය පායා තිබිය දී, හත් වෙනි සූර්යයා පායනවා. හත්වෙනි සූර්යයා පායන විට

අර දුම් දම දමා තිබුණ මහා පෘථිවිය, සිනේරු පර්වත රාජයා ගිනි ගන්න පටන් ගන්නවා. ගිනි ඇවිලිලා ගිනි ජාලා වලින් වෙලී යනවා. අන්තිමේ දි යොදුන් ගණන් උස පර්වත කූට පුපුරලා කෑලි කෑලි වලට පුපුරලා විනාශ වෙන්න පටන් ගන්නවා. අන්තිමේ දී සිනේරු පර්වත රාජයාත් මේ මහා පෘථිවියත් කෑලි කෑලි වලට කඩාගෙන ගිහිල්ලා සුන්නත්ධූලි වෙලා යනවා. අතුරුදහන් වෙලා යනවා. පින්වතුනි, මෙතන දි බුදුරජාණන් වහන්සේ වදාරනවා, පින්වත් මහණෙනි, මහා පෘථිවිය පිපිරී ගිය පසු එතන කපුරු පිළිස්සූ තැනක් වගේ, ගිතෙල් පිළිස්සූ තැනක් වගේ. දැලි ත් නෑ. අළු ත් නෑ. ඒ කියන්නේ දූවිල්ලක් වත් ඉතුරු නැතිව මේ පෘථිවිය අතුරුදහන් වෙනවා.

## කවදාද මේ විනාශේ....

මේක සිද්ධ වෙන්නේ මේ මහා භද්‍ර කල්පය අවසන් වුනා ම. මෛත්‍රී බුදුරජාණන් වහන්සේ පහළ වී අවසන් වුනාටත් පස්සෙ. මං හිතන්නේ ඊට පස්සේ කල්ප ගණනාවක් බුදුවරු නැහැ.

**(එවං අනිච්චා භික්ඛවේ, සංඛාරා)** "මහණෙනි, මේ විදිහට ම සංස්කාර අනිත්‍ය යි" **(අද්ධුවා භික්ඛවේ, සංඛාරා)** "මහණෙනි, හේතු ඵලයන් ගෙන් හටගත්ත සියවි දේ ම අස්ථිරයි." **(අනස්සාසිකා භික්ඛවේ, සංඛාරා)** "මහණෙනි, හේතු ඵලයන් ගෙන් හට ගත්ත දේ අස්වැසිලි රහිත යි." **(යාවඤ්චිදං භික්ඛවේ, අලමේව සබ්බසංඛාරේසු නිබ්බින්දිතුං)** "මහණෙනි, එම නිසා හේතු ඵලයන් ගෙන් හටගත්ත සියවි දෙය ගැන ම අවබෝධයෙන් ම කළකිරෙන්න ම යි වටින්නෙ." **(අලං විරජ්ජිතුං)** "අවබෝධයෙන් ම නො ඇලෙන්න ම යි වටින්නෙ." **(අලං**

විමුච්චිතුං) "අවබෝධයෙන් ම නිදහස් වෙන්න ම යි වටින්නෙ."

## අතිශයින් ම සෝවාන් අයට පමණ යි.

ඊට පස්සෙ බුදු රජාණන් වහන්සේ හරි අපූරු දෙයක් වදාරනවා. මහණෙනි, ඔය කාරණය ඒ කියන්නේ මේ මහා පෘථිවියේ හා සිනේරු පර්වත රාජයා ගේ විනාශය ගැන මම සම්මා දිට්ඨිය ඇති අය එක්ක හැර වෙන කා සමඟ නම් කතා කරන්න ද? කවුරු නම් පිළිගනීවි ද? ඒකට හේතුව මොකක් ද? සම්මා දිට්ඨිය ඇති අය දන්නවා, අනිත්‍ය දේ අනිත්‍ය හැටියට, දුක් දේ දුක් හැටියට, තමා ගේ වසඟයේ පැවැත්විය නොහැකි දේ අනාත්ම වශයෙන් දන්නවා. එබඳු කෙනෙකුට මේ අනිත්‍ය ගැන කතා කිරීම කළ හැකි දෙයක්. වෙන කෙනෙකුට කිව්වොත් එහෙම කොහෙ වෙන්න ද ව්වා කියල අහනවා. ඇයි ඒ? අනිත්‍යය යි කියන කාරණය දන්නෙ නෑ.

## නුවණ නැතිව බණින අයට...

එතකොට බලන්න බුදු රජාණන් වහන්සේ වදාරනවා, කවුරු නම් මේවා පිළිගනියි ද? මාර්ග ඵල නිවන් අවබෝධය පිණිස ගමන් කරන අය හැර. ඇයි ඒ? ඒකට හේතුව එතකොට අපිට පේනවා, බුදුරජාණන් වහන්සේ ගේ කාලෙත් ඉඳලා තියෙනවා, මේ ප්‍රඥාව පිළිගන්නේ නැති අය. අද කොච්චර අපේ රටේ ඉන්නව ද? නමුත් බටහිර සුද්දෙක් මොකක් හරි කිව්වොත් බුදු කෙනෙක් පහල වුනා වගේ පිළිගන්නවා. බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රඥාවට අලගු තියන්නවත් පුළුවන් කමක් නෑ කාටවත්.

## බටහිරට ම දත නියවන...

දැන් බලන්න බටහිර පෘථග්ජන මිනිසුන් ගේ මතවාද වලට මේ රටවල මිනිස්සු කොච්චර අහුවෙලා ද? ගිලල ද? එගොඩ වෙන්න බැරුව දඟලනව ද? දැන් බටහිර සුද්දෙක් කිව්වොත් මේ ලෝකය කවදාවත් විනාශ වෙන්නෙ නෑ කියල ඒක මේ මිනිස්සුන්ට ඇත්ත. අන්න ඒ වගේ බටහිර ගැති මානසිකත්වය විසින් අපිට නැගිටින්න තිබෙන සෑම පැත්තකින් ම අවුරලා තියෙනවා. ඉතින් ඒ නිසා අපි මේක හොඳින් තේරුම් ගන්න ඕනෙ, විද්‍යාව කියන බටහිර ගැති චින්තනය තුළ ඉන්න කල් අපිට මේ ධර්මය අවබෝධ කර ගන්න බැරිව යනවා.

## පෙර ජීවිත පන්සිය පනහ ද?

දැන් බලන්න බුදුරජාණන් වහන්සේ ගේ මේ දේශනය තව තියෙනවා. ඊළඟට බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ ගේ අතීත සිදුවීමක් මෙතන දි හෙළිදරව් කරනවා. උන්වහන්සේ ඉඳලා තියෙනවා, සුනෙත්ත කියල ශාස්තෘන් වහන්සේ නමක් වෙලා. ඒ සුනෙත්ත ශාස්තෘන් වහන්සේ පංච කාමයන්ට නො ඇලී සිටිය කෙනෙක්. මේ සුනෙත්ත ශාස්තෘන් වහන්සේට හිටියා ශ්‍රාවකයින් සිය ගණනක්. මේ සුනෙත්ත ශාස්තෘන් වහන්සේ තම ශ්‍රාවකයන්ට බ්‍රහ්ම ලෝකයේ උපදින ආකාරය ඉගැන්වූවා. ඒ කාලෙ උන්වහන්සේ දැනගෙන හිටියේ ඒ දේ ගැන පමණ යි. ධ්‍යාන ලබන හැටි, සමාපත්ති ලබන හැටි උගන්වලා තියෙනවා.

## තෝරාගන්න ඕනෙ ම ලෝකයක්...

ඉතින් ඒ කාලෙ ඒ සුනෙත්ත ශාස්තෘන් වහන්සේ බඹ ලොව උපත ලබන අයුරු ශ්‍රාවකයන්ට පෙන්වා දෙද්දි

ඇතැම් ශ්‍රාවකයන් ඒ මාර්ගය දියුණු කරල බඹ ලොව ඉපදුනා. ඒ මාර්ගය පැහැදිලි කරල දෙද්දි ඇතැම් ශ්‍රාවකයින් බඹ ලොව ඉපදෙන්න බැරිව, නමුත් පරනිම්මිත වසවත්ති දිව්‍ය ලෝකයේ ඉපදුනා. ඇතැම් ශ්‍රාවකයින් ඒ මාර්ගය දියුණු කරගෙන යද්දි නිම්මාණරතී දිව්‍ය ලෝකයේ ඉපදුනා. ඇතැම් ශ්‍රාවකයින් එය දියුණු කරගෙන යද්දි තුසිත දිව්‍ය ලෝකයේ ඉපදුනා. ඇතැම් ශ්‍රාවකයින් එය දියුණු කරගෙන යද්දි යාම දිව්‍ය ලෝකයේ ඉපදුනා. ඇතැම් ශ්‍රාවකයින් එය දියුණු කරගෙන යද්දි තාවතිංස දිව්‍ය ලෝකයේ ඉපදුනා. ඇතැම් ශ්‍රාවකයින් එය දියුණු කරගෙන යද්දි චාතුම්මහාරාජික දිව්‍ය ලෝකයේ ඉපදුනා. ඇතැම් සව්වන් එය දියුණු කරගෙන යද්දි දෙව් ලොව ඉපදුනේ නැතිව මිනිස් ලොව රාජකීය පවුල්වල ඉපදුනා. ඇතැම් අය ඒ මාර්ගය දියුණු කර ගෙන යද්දි උගත් මිනිසුන් ගේ පවුල් වල ඉපදුනා. ඇතැම් අය ධනවත් ගෘහපතියන් ගේ පවුල් වල ඉපදුනා. දැන් මේ කියන්නේ බුදුරජාණන් වහන්සේ නමක් හැටියට ඉඳලා ධර්ම දේශනා කරන කාලෙ නෙවෙයි. මේ පෙර ජීවිතයෙ ඍෂිවරයෙක් වෙලා ඉඳලා දියුණු කරපු එකක්. එතකොට මේ සුනෙත්ත කියන ශාස්තෲන් වහන්සේ ට මෙහෙම හිතුණා. “මම යි ශ්‍රාවකයො යි එක සමාන යි. එම නිසා මම ශ්‍රේෂ්ඨත්වයට පත් වෙන්න ඕනෙ” කියලා, කල්පනා කළා “මම දැන් මෛත්‍රී ධ්‍යාන පුරුදු කරන්න ඕනෙ” කියලා.

## මෛත්‍රියේ ආනිසංස...

මෛත්‍රී ධ්‍යාන වඩන්න පටන් ගත්තා හත් අවුරුද්දක් නොකඩවා ම. ඊට පස්සෙ තියෙනවා, මහණෙනි, හත් අවුරුද්දක් නොකඩවා ම මෛත්‍රී ධ්‍යාන වැඩූ නිසා මේ සුනෙත්ත ශාස්තෲන් වහන්සේ සංවට්ට

කල්ප, විවට්ට කල්ප හතක් මිනිස් ලෝකයට ආවේ නෑ. සංවට්ට කල්ප කියන්නේ ලෝකය විනාශ වේගෙන යන කාලයට. විවට්ට කල්ප කියන්නේ ලෝකය නැවත සකස් වේගෙන යන කාලයට. ලෝකය විනාශ වේගෙන යද්දී ආභස්සර ලෝකෙ ඉපදෙනවා. ලෝකෙ නැවත සකස් වේගෙන යද්දී ශූන්‍ය බ්‍රහ්ම විමාන වල උපදිනවා.

## දෙතිස් මහා පුරුෂ ලකුණු තිබිලත්...

Internet Version of MSP www.gautamabuddha.org www.mahamevna.org

ඒ සංවට්ට කල්ප, විවට්ට කල්ප ගෙවුනට පස්සේ මහා බ්‍රහ්මයා වෙලා ඉපදුනා. ඒ වගේ ම තිස් හය වතාවක් සක්‍ර දෙවියා වෙලා ඉපදුනා. බලන්න අපි ජාතක පොත කියවලා හිතන් ඉන්නෙ පන්සිය පණහක් උපන්නා කියලනෙ. ඊළඟට කියනවා, මහණෙනි ඒ ශාස්තෘන් වහන්සේ ඒ විපාක වලින් ම නොයෙක් සිය ගණන් වාරයක් සක්විති රජ වෙලා ඉපදුනා කියල. ඒ කියන්නේ සිය ගණන් වාරයක් දෙතිස් මහා පුරුෂ ලක්ෂණ ඇතිව ඉපදිලා බුදු බව සාක්ෂාත් කරල නෑ. පේනවා නේද බුද්ධත්වය කොයිතරම් ලබන්ට දුර්ලභ දෙයක් ද කියල. මේවා කල්පනා නො කිරීම නිස යි, සමහරු බුදු බව පතන්නේ.

බුදුරජාණන් වහන්සේ ඊළඟට වදාරනවා, මහණෙනි, මේ සුනෙත්ත ශාස්තෘන් වහන්සේ මේ තරම් දීර්ඝ කාලයක් ගත කළාට සංසාරෙන් නිදහස් වෙන්න බැරුව ගියා. ජාති, ජරා, ව්‍යාධි, මරණ, දුක්, දොම්නස්, සුසුම් හෙළීම් වලින් නිදහස් වෙන්න බැරුව ගියා. දැන් මේකෙන් අපිට අනිත්‍ය බවත්, සසරේ දීර්ඝ බවත් සිතාගත හැකි යි. අපේ අනවබෝධය නිසා අපිට මේක මේ තරම් දීර්ඝ යි කියල තේරෙන්නෙ නෑ.

## සමාධිය කොපමණ වැඩුවත්...

බුදුරජාණන් වහන්සේ වදාළා, මහණෙනි, ඒ සුනෙත්ත ශාස්තෘන් වහන්සේට නිදහස් වෙන්න බැරුව ගියා, ඉපදීමෙන්, දුක් දොම්නස් වලින්. මේ එක දිගට කියන්නේ දුගතියක් ගැන කතා කරන්නේ නැතිව, සුගතිය ගැන කතා කරල තියෙන්නෙ. ජාති, ජරා, මරණ දුකෙන් නිදහස් වුනේ නෑ කියල. සාමාන්‍ය සත්වයා යන්නේ දුගතියෙ ගමන් කර කර.

## පෙරේත ලෝකෙ කෑම ලිස්ට් එක....

එක පෙරේතියක් කියනවා, ඒ ගොල්ලො කන කෑම ලිස්ට් එක. සොටු කනවා කියනවා මේ මිනිස් ලෝකෙ බත් මාළු කාපු අය. ගැබ් මළ. ඊළඟට අසූචි, ස්ත්‍රීන් ගේ සිරුරු වලින් පහවෙන පිළිකුල් දේ. මේවා තමයි කන්න තියෙන්නේ. එබඳු සසර ගමනක් ගැන බුදුරජාණන් වහන්සේ වර්ණනා කරයි ද?

## කරුණු හතරක් නැතිව ගිය දුරක් ....

ඊළඟට බුදුරජාණන් වහන්සේ වදාළා, ඇයි මහණෙනි, මෙහෙම වුනේ? කරුණු හතරක් ඒ සුනෙත්ත ශාස්තෘවරයාට අවබෝධ කරගන්න බැරිව ගියා. ඒ තමයි, ආර්ය ශීලය, ආර්ය සමාධිය, ආර්ය ප්‍රඥාව, ආර්ය විමුක්තිය.

ඊළඟට බුදු රජාණන් වහන්සේ වදාළා, මහණෙනි, දැන් මම ඒ ආර්ය ශීලය අවබෝධ කර ගත්තා. ආර්ය සමාධිය අවබෝධ කර ගත්තා. ආර්ය ප්‍රඥාව අවබෝධ

කර ගත්තා. ආර්ය විමුක්තිය අවබෝධ කර ගත්තා. දැන් මට මේ භව තණ්හා සියල්ල නැති වෙලා තියෙන්නෙ. භව රැහැන් සියල්ල බිඳිල තියෙන්නෙ. ආයෙත් නම් උපතක් නැහැ.

බුදුරජාණන් වහන්සේ ඒක දේශනා කරල, ගාථා දේශනා කරනවා.

**සීලං සමාධි පඤ්ඤා ච විමුත්ති ච අනුත්තරා**
**අනුබුද්ධා ඉමේ ධම්මා ගොතමේන යසස්සිනා**

බුදුරජාණන් වහන්සේ වදාළා සීල, සමාධි, ප්‍රඥ අනුත්තර වූ විමුක්තිය යන මේවා අවබෝධ කර ගත්තා. කීර්තිමත් ප්‍රඥා ඇති ගෞතම බුදුරජාණන් වහන්සේ.

**ඉති බුද්ධෝ අභිඤ්ඤාය ධම්මමක්ඛාසි භික්ඛුනං**
**දුක්ඛස්සන්තකරෝ සත්ථා චක්ඛුමා පරිනිබ්බුතො**

ඒ බුදුරජාණන් වහන්සේ මේ ආර්ය සීල, ආර්ය සමාධි, ආර්ය ප්‍රඥා, ආර්ය විමුක්ති අවබෝධ කරගෙන භික්ෂූන් වහන්සේලාට මේ ධර්මය කියා දුන්නා. මේ දුක් අවසන් කරපු ශාස්තෘන් වහ්නසේ පිරිනිවන් පානවා.

## එක ම එක ප්‍රශ්නය යි

බලන්න මේ දේශනාව කොයිතරම් අංග සම්පූර්ණ ද? බුදුරජාණන් වහන්සේ ගේ දේශනා මේ විදිහට අංග සම්පූර්ණව අපිට අහන්න ලැබෙන්න වනෙ. එතකොට තමයි අපිට බුදු රජාණන් වහන්සේ කවුද? උන් වහන්සේ ගේ අවබෝධය කුමක් ද? උන්වහන්සේ අපට ශාස්තෘන්

වහන්සේ වන්නේ ඇයි? මේ සියල්ල අපට වටහා ගන්න පුළුවන් වෙන්නේ. මේකෙ විශේෂත්වය මේකයි. මේ සූත්‍ර දේශනාව ඇහුවා ම ඔබට ඇතිවෙන්න ඕනෙ ප්‍රශ්නයක්. එක ම එක ප්‍රශ්නයක්. ගොඩක් ප්‍රශ්න ඇතිවුනොත් එහෙම පටලවා ගෙන තියෙන බව පේනවා.

දැන් ඔබට මතක ඇති මේ සූත්‍රයේ අනිත්‍ය ගැන යි, ඉරවල් හතක් පෑයීම ගැන යි, සිනේරු පර්වතය හා පෘථිවිය විනාශ වීම ගැන යි, සුනෙත්ත ශාස්තෘන් වහන්සේ ගැන යි, ධ්‍යාන සමාපත්ති ගැන යි, සුගතියේ උපත ගැන යි, මේවනේ විස්තර වුනේ. මේ ඔක්කොමත් එක්ක මේවායේ හරය ප්‍රශ්නයක් හැටියට ඔබට එන්න ඕනෙ. මං ඒ ප්‍රශ්නය ඔබ තුල නගන්නම්, මොකක් ද ඒ ප්‍රශ්නය?

## අර්ථය හරියට ගත්තා නම්...?

අපි කවදා නම් ආර්ය ශීලය ඇති කර ගන්න ද? අපි කවදාද ආර්ය සමාධිය ඇති කර ගන්නේ? ආර්ය ප්‍රඥාව කවදාද ඇති කර ගන්නේ? ආර්ය විමුක්තිය කවදාද ඇති කර ගන්නේ? ඔය ප්‍රශ්න ටික විතරක් ඇති වුනා නම් ඔබට මේ සූත්‍රය තේරිලා තියෙනවා. ඒ අදහස අහුවෙන්නෙ නැතිව වෙන වෙන දේවල් අහු වුනා නම් අර්ථය අරගෙන නෑ. මම මේ සූත්‍රය කියා දීල අර්ථය ගන්න හැටි මේ කියා දුන්නෙ. ඉතින් මේ ආර්ය සීල, ආර්ය සමාධි, ආර්ය ප්‍රඥා, ආර්ය විමුක්ති අවබෝධ කරගන්නා තාක් අපිට ඉපදීමෙන්, ජරා, මරණ යෙන් හෝ සුසුම් හෙලීම් වලින් නිදහස් වීමක් නැහැ.

## සුන්දරයි ද සසර ගමන?

කෙළවරක් නැති සංසාර ගමනේ අපට යන්න සිද්ධ

වෙනවා. මේක අවබෝධ වෙච්ච නැති අය අර සුනාමි සිදුවීම දිහා බලලා කියනවා, අපිට මේ වගේ මිනී ගොඩවල් ගහනවා දකින්න කරපු පව මොකක් ද? හිතේ තියෙන්නේ හැමදාම සුන්දර දේවල් දැක දැක සංසාරෙ යන්න. එහෙම වෙන්නෙ නෑ. සංසාරය මොකක් ද කියලා අවබෝධය නැතිකම ම යි ඒකට හේතුව. මිනිස් ලෝකෙ දි ඔහොම නම් අපි හිතාගන්න විනෙ, අනෙක් ලෝක කොහොමට ඇද්ද? ප්‍රේත වස්තුවේ සඳහන් වෙන විදිහට පෙරේතයින් කන කෑම දැක්කා ම උපත කියන එක අන්තයට ම පිළිකුල් වෙනවා. මෙවැනි සංසාරයක ද අපිට යන්න තියෙන්නෙ කියල. මෙවැනි ජරාව ද කන්න තියෙන්නෙ කියල. ඒවා එච්චරට ම පිළිකුල්. ලොකු විනෙකමක් ඇති වෙන්න විනෙ, අනේ ඉක්මනට සෝවාන් වෙන්න විනෙ, නැත්නම් අපිත් මේ ගොඩට වැටෙනවා කියල.

## හිනා හිනා මෝඩ හිනා....

අන්න ඒ පණ්ඩවුඩය තමයි මේ ධර්මයෙන් ගන්න තියෙන්නේ. සමහරු කියනවා මේ සුනාමිය දිහා බලලා, අනේ මෙවන් විපතක් උපනුපන් ආත්මයක වෙන්න එපා කියල. නමුත් යන්න තියෙන්නේ ඒවාට මුහුණ දිදී ම යි. ජරා, මරණ, සෝක, වැලපීම්, දුක්, දොම්නස්, සුසුම් හෙළීම් වලින් තොර උපතක් බුදුරජාණන් වහන්සේ දන්නව නම් උන්වහන්සේ ඒකාන්ත වශයෙන් ම ඒක අපිට කියනවා. ඒකයි බුදුරජාණන් වහන්සේ වදාළෙ ප්‍රමාද වීම අන්තිම භයානක දෙයක් කියල.

මතකද අර කාන්තාවන් පිරිසක් මත්පැන් බීලා බුදුරජාණන් වහන්සේ වදාළේ මොකක් ද?

**කොනු හාසෝ කිමා නන්දෝ - නිච්චං පජ්ජලිතේ සති**
**අන්ධකාරේන ඔනද්ධා - පදීපං න ගවෙස්සථ**

මොනවට උඹලා හිනා වෙනව ද? උඹලට මොකක් ලැබිල ද? උඹලා හැම තිස්සෙ ම ගිනි ගන්නවා. අවිද්‍යාව නැමැති අන්ධකාරයේ ගිලී සිටින පිරිස ප්‍රඥාව නමැති පහන නො සොයන්නේ ඇයි?

## ඔක්කොමලා නිවන් දැක්කොත් ...?

බලන්න ඒ පණිවුඩය, අපිත් අල්ලගන්න ඕනෙ. ඒ පණිවුඩය අල්ල ගත්තෙ නැත්නම් අපිත් ඔහේ කියවපු පිරිසක් වෙලා ඔහේ ඉපදි ඉපදී යයි. අපි හොඳට මතක තියා ගන්න ඕනෙ, යථාර්ථය කියන එක සියව් දෙනා ම අල්ලන්නේ නෑ. සමහරු නම් කියනවා මේ ඔක්කොම නිවන් දකිනවා. නමුත් බුදුරජාණන් වහන්සේ වදාළේ මෙහෙම යි.

මහණෙනි, මේ ධර්මය අවබෝධ නො කරන පිරිස මහ පොළොව හා සමාන යි. නිවන් අවබෝධ කරන පිරිස, නියපොත්තට පස් චුට්ටක් අරගෙන වදාළා, මෙන්න මෙච්චර යි කියල. අනික් අය දිගින් දිගට ම දුක් විඳ විඳ සංසාරෙ යන්නේ. සමහරු දන්නෙ නැතිව අහනවා, ඔච්චර ධර්මය අහගෙන ගිහින් ඔක්කොම නිවන් දැක්කොත් මොකද වෙන්නෙ කියල? ඔබෙනුත් අහවි. එතකොට කියන්න බුද්ධ දේශනාවෙ තියෙන විදිහට නිවන් නො දකින පිරිස, මහ පොළොවේ පස් හා සමාන යි. නිවන අවබෝධ කරන පිරිස නිය පොත්තට ගත්තු පස් ස්වල්පය හා සමාන යි කියල.

Internet Version of MSP www.gautambuddha.org www.mahamevna.org

## ආර්ය ශීලය නිසා.....

බලන්න කොයි තරම් දුර්ලභ දෙයක් ද මෙය. ආර්ය ශීල, ආර්ය සමාධි, ආර්ය ප්‍රඥා, ආර්ය විමුක්ති ඇති කර ගන්න ඕනෙ. ආර්ය කියන්නේ සම්මා දිට්ඨියෙන් යුතු නිසා. සම්මා දිට්ඨියෙන් යුතු සීලය ආර්ය ශීලය යි. සම්මා දිට්ඨියෙන් යුතු සමාධිය ආර්ය සමාධිය යි. ආර්ය මාර්ගය තුළින් ඇතිවන ප්‍රඥාව ආර්ය ප්‍රඥාව යි. ආර්ය අෂ්ඨාංගික මාර්ගය ප්‍රගුණ කිරීමෙන් ඇති වන අවබෝධයෙන් කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා ප්‍රහාණය වීමෙන් ලබන විමුක්තිය ආර්ය විමුක්තිය යි.

මෙන්න මේ කරා යන්න අපට උපකාර වෙන්නේ, බුදුරජාණන් වහන්සේ ගේ ධර්මය පමණ යි. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙන් තොරව ලෝකයේ කිසි ම කෙනෙකුට ශීලය පණවන්න බැහැ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙන් තොරව ආර්ය සමාධියක් පණවන්න බැහැ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙන් තොරව ආර්ය ප්‍රඥාවක් පණවන්න බැහැ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙන් තොරව ආර්ය විමුක්තියක් පණවන්න බැහැ. එහෙනම් යමෙක් සීලය කුමක් ද කියල දැන ගන්න ඕනෙ නම් ඒ ධර්ම විනය තුලින් ම යි දැන ගත යුත්තේ. සමාධිය කුමක් දැයි කියා දැන ගන්න ඕනෙ නම් ඒ ධර්ම විනය තුලින් ම යි දැන ගත යුත්තේ. ප්‍රඥාව කුමක් දැයි දැනගන්න නම් ඒ ධර්ම විනය තුළින් ම යි දැන ගත යුත්තේ.

## ධර්ම විනයෙන් බැහැරව නම්....

ධර්ම විනයෙන් තොර ශීලය අංග සම්පූර්ණ සීලයක් නො වෙයි. ධර්ම විනයෙන් බැහැර වූ සමාධිය

අංග සම්පූර්ණ සමාධියකුත් නො වෙයි. ධර්ම විනයෙන් බැහැර වෙච්ච ප්‍රඥාව අංග සම්පූර්ණ ප්‍රඥවකුත් නො වෙයි. එම නිසා ධර්ම විනය බැහැර වුන තැන විමුක්තියක් ද නැහැ. ඒ නිසා බුදුරජාණන් වහන්සේ ගේ ධර්ම විනය ම අපි කියවිය යුතුයි. අංග සම්පූර්ණ සීලය විස්තර වෙන්නේ බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයේ. අංග සම්පූර්ණ සමාධිය විස්තර වෙන්නෙත් බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයේ. ඒ ධර්මයේ තමයි ප්‍රථම ධ්‍යානය යනු මෙය යි කියල විස්තර වෙන්නේ. ඒ ධර්මයේ තමයි දෙවැනි ධ්‍යානය මෙය යි කියල විස්තර වෙන්නෙ. ඒ ධර්මය තුළ තමයි තුන් වෙනි ධ්‍යානය මෙය යි කියල විස්තර වෙන්නේ. ඒ ධර්මය තුළ තමයි හතරවෙනි ධ්‍යානය මෙය යි කියල විස්තර වෙන්නේ.

## ධර්මයෙන් තොරව ආර්ය විමුක්තියක් කරා...?

ඒ නිසා ඒ ධර්මය තුල සමාධිය විස්තර කරන නිසා සීලය වඩන කෙනා ධර්ම විනයට ම ප්‍රශංසා කරමින් සීලය වඩනවා. සමාධිය වඩන කෙනා ධර්ම විනයට ම ප්‍රශංසා කරමින් සමාධිය වඩනවා. ධර්මය බැහැර කරනවා නම් ඒ සමාධිය ආර්ය සමාධියක් වෙන්න බැහැ. ඒ සමාධිය ආර්ය සමාධියක් නම්, ධර්ම විනයට ප්‍රශංසා කර කර යන සමාධියක් විය යුතුයි. ප්‍රඥව යමෙක් වඩනවා නම්, ඒක ධර්ම විනයට ම ප්‍රශංසා කර කර වඩන ප්‍රඥවක් විය යුතුයි.

ඒ නිසා බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙන් තොරව ආර්ය ශීලයක් නැහැ. බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙන් විනයෙන් තොරව ආර්ය සමාධියකුත් නැහැ. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්ම විනයෙන් තොරව

ආර්ය ප්‍රඥාවකුත් නැහැ. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්ම විනයෙන් තොර ආර්ය විමුක්තියකුත් නැහැ. ඒකයි රහතන් වහන්සේලා ඒ ඒ බුද්ධ දේශනා රහත් පරපුරවල් වලට භාර ගත්තේ, කට පාඩමින් මේ ධර්මය රැගෙන එන්න ඕනෙ කියල.

## ධර්මය මේ තරම් දුර ආවේ....

මහණ වෙන අයට කට පාඩම් කෙරෙව්වා, රහතන් වහන්සේලා ළඟ පැවිදි වෙච්ච පිරිස ඒ ධර්මය කට පාඩම් කර කර ශීලය ප්‍රගුණ කළා. සමාධිය ප්‍රගුණ කළා. ප්‍රඥාව ප්‍රගුණ කළා. අරහත්වයට පත් වෙන කම් සිත දියුණු කර ගත්තේ ධර්ම විනය කට පාඩම් කර ගන්න ගමන්. ඒ නිසයි පිරිසිදු ධර්මය මුඛ පරම්පරාවෙන් දිගින් දිගට ම පැවතුනේ. ඒ නිසා ඒක අපිට අවිතින් පටන් ගන්න වෙලා තියෙනවා. දැන් ලෝකෙ නැහැ.

මේ ධර්මයේ එක ම එක ඉලක්කය යි තියෙන්නේ. ඒ චතුරාර්ය සත්‍යය අවබෝධය කරගැනීම. මේ යන ගමනේ දී අපිට මුලින් ම උවමනා වෙන්නෙ ශ්‍රද්ධාව යි. අපි එක එක්කෙනාගෙ අවබෝධය ගැන පහදින්න නෙමෙයි මේ ශාසනයට ඇතුල් වුනේ. අපි මේ ශාසනයට ඇතුල් වෙන්නෙ බුදුරජාණන් වහන්සේ ගේ අවබෝධය ගැන පැහැදීමට යි.

## අවබෝධය සරණ යමු...

තථාගතයන් වහන්සේ ගේ අවබෝධය ගැන පහදින්න ඕනෙ. පැහැදිලා ඒක අදහා ගන්නවා. "අරහං". බුදුරජාණන් වහන්සේ රාග, ද්වේෂ, මෝහ නැති කෙනෙක්

කියල. චතුරාර්ය සත්‍යය ධර්මය ගුරූපදේශ නැතිව අවබෝධ කරපු කෙනෙක්. **“සම්මා සම්බුද්ධ”** ඒ අවබෝධයට අනුව ම ජීවිතය පවත්වා වදාළ කෙනෙක්. **“විජ්ජා චරණ සම්පන්න”** ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කොට නිවන අවබෝධ කරපු කෙනෙක්. **“සුගත”** සකල ලෝකයන් ගැන අවබෝධයෙන් ඉඳලා ඒ සියව් ලෝක වලින් නිදහස් වෙච්ච කෙනෙක්. **“ලෝකවිදූ”** දමනය කළ නො හැකි වූ අය දමනය කිරීමේ අනුත්තර වූ උත්තමයන් වහන්සේ, **“අනුත්තරෝ පුරිස දම්ම සාරථී”.** දෙවියන්ගේත්, මිනිසුන්ගේත් ශාස්තෘන් වහන්සේ **“සත්ථා දේව මනුස්සානං”.** අවබෝධ කොට වදාළ උතුම් ධර්මය අන් අයට අවබෝධ කර ගැනීමට මහා කරුණාවෙන් දේශනා කළ කෙනෙක්, **“බුද්ධ”.** මේ සියව් ගුණ දරා ගැනීමට තරම් භාග්‍යවන්ත කෙනෙක්. **“භගවා”.**

අන්න ඒ පැහැදීම තමයි ධර්මයේ හැසිරීමේ ආරම්භය. ඒ පැහැදීමට ආපු නැති කෙනා කැරකි කැරකි එන්නේ තමාගේ මතයට යි. තමන් ගේ දේ ම හුවා දක්වනවා. නමුත් ශ්‍රද්ධාවට පැමිණිච්ච කෙනා එහෙම නෑ. ශ්‍රද්ධාවට පැමිණිච්ච කෙනා තමන් ගේ දේ අත්හැරල ධර්මය පිළිගන්නවා. අන්න ඒක තමයි, අවබෝධයෙන් ම ශ්‍රද්ධාවට පැමිණිච්ච කෙනා තේරුම් ගන්නට තියෙන ලක්ෂණය. මොකද, බුදුරජාණන් වහන්සේ අපිට දේශනා කරලා තියෙනවා, සප්ත අපරිහානීය ධර්ම. ඒ වගේ ම කරුණු හතරක් ගැන නිතර ම විමස විමසා බලන්න කියල. මොනවද ඒ?

## මෙහෙමයි ගලපා බලන්නෙ

සමහර විට ලෝකෙ ප්‍රසිද්ධ කෙනෙක් කියන්න පුළුවන් ධර්මය මෙය යි, විනය මෙය යි, ශාස්තෘ ශාසනය

මෙය යි කියල. බුදු රජාණන් වහන්සේ වදාළා ඒක පිළිගන්නත් එපා, ප්‍රතික්ෂේප කරන්නත් එපා. ධර්මයට විනයට දාල බලන්න. ධර්මය හා විනය ට ගැලපෙන්නෙ නැත්නම් ඒක බැහැර කරන්න කියනවා මෙය ධර්මය නෙවෙයි කියලා. මෙය විනය නෙමෙයි, මෙය ශාස්තෘ ශාසනය නෙවෙයි කියලා.

ඊළඟට සඟ පිරිසක් සම්මත කරනවා මෙය යි, ධර්මය, මෙය යි විනය, මෙය යි ශාස්තෘ ශාසනය කියල. ඒත් පිළිගන්නත් එපා, ප්‍රතික්ෂේප කරන්නත් එපා. ධර්මය විනයෙහි ලා බලන්න. ධර්මය විනයට ගැලපෙන්නේ නැත්නම් ඒක අතහරින්න කියනවා. මේ ස්වාමීන් වහන්සේලාට වැරදිලා. වැරදි විදිහට අල්ලගෙන කියල.

ඊළඟට සංඝයා සම්මත කරනවා අසවල් භික්ෂුව ධර්ම විනය මනා කොට කියනවා කියල. ඒකත් ධර්මයෙහි විනයෙහි ලා බලන්න කියනවා. එහෙම නැත්නම් සංඝ පිරිසක් එකතු වෙලා කියනවා මෙය යි ධර්මය, මෙය යි විනය කියලා. ඒකත් ධර්මයෙහි ලා විනයෙහි ලා බලන්න කියනවා. ධර්ම විනයට ගැලපෙන්නේ නැත්නම් පිළිගන්න එපා කියනවා. මේවාට කියන්නේ සතර මහාපදේශ කියල. ආනන්ද චෛත්‍යස්ථානයේ දි අපට බුදුරජාණන් වහන්සේ වදාළෙ. අනාගතයේ දි යම් යම් ආරවුල් ඇති වුනොත් ධර්ම විනයේ බහා බලන්න කියලා.

මේ කරුණු ඉගෙන ගන්න කෙනා ධර්ම විනයේ බහා බලමින් කිසි ම ගැටළුවක් නැතිව ධර්ම විනයේ ඉදිරියට යනවා. මොකද? මම එහෙම කිව්වෙ ධර්ම විනයේ බහා බලන්න බැරි අය තමයි මේ ලෝකෙ ඉන්නෙ. ධර්ම විනය නො හඳුනන කෙනෙක්, ධර්ම විනයේ බහා බලන්න

දන්නෙ නෑ. එතකොට ධර්මය කියලා හිතාගෙන ධර්මයේ ස්වරූපයෙන් තිබෙන වෙනත් දෙයක් පුරුදු කරන්න පුළුවන්.

ධර්මය දන්න කෙනාට ප්‍රශ්ණයක් නෑ. එයා විනෑ ම පරිසරයක, විනෑ ම සමාජයක, විනෑ ම පිරිසක් මැද්දේ ප්‍රශංසා කරන්නේ ධර්මයට ම යි. ඒකට හේතුව රහතන් වහන්සේලා තමාව හුවා නො දැක්වීම. රහතන් වහන්සේලා කවදාවත් තමාව හුවා දැක්වුවේ නෑ. මේක මගේ අත්දැකීම. මේක මගේ අවබෝධය කිය කියා. උන්වහන්සේලා හැම තිස්සෙ ම ප්‍රශංසා කරන්නෙ බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයට ම යි.

සෝතාපන්න කෙනාත් බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයට ම යි ප්‍රශංසා කරන්නේ. මාර්ගයේ ගමන් කරන පිරිස හඳුනා ගන්න පුළුවන් තැනක් තමයි ඔතන. එයා මේ මාර්ගයේ ගමන් කරද්දී තමන් ගේ නායකත්වයක්, තමන් ගේ අවබෝධයක්, තමන් ගේ අත්දැකීමක් අන් අයට දීමක් කරන්නෙ නෑ. එයා බුදුරජාණන් වහන්සේ මේ විදිහට දේශනා කළා, මේ විදිහට දේශනා කළා කිය කිය ධර්මය ම කියා දෙනවා. ඒක මේ සූත්‍ර දේශනා කියවද්දි ඉතා ම පැහැදිලිව අපට තේරෙනවා. අපිට විනෙ කරන්නේ අන්න ඒ වගේ ශ්‍රද්ධාවක්.

## බුද්ධ ශාසනය කියන්නෙ ගොඩනැගිලි ද?

සමහරු හිතන් ඉන්නවා බුද්ධ ශාසනය කියන්නේ මහා ගොඩනැගිලි, මහා පින්කම් කියල. ඉතින් ඒවා හදලා එයා සතුටු වෙනවා මම ශාසනය වෙනුවෙන් සෑහෙන්න කළා කියල. ශාසනය වෙනුවෙන් එයා කරපු දෙයක් නෑ.

සමහරු සීලය සම්පූර්ණ කර ගන්නවා. එයා හිතනවා මම ශාසනයෙන් ප්‍රයෝජනය ගත්තා කියල. ප්‍රයෝජනය ගත්තා මදි. බුදුරජාණන් වහන්සේ ගේ ශාසනය ගහක් වගේ. ගහක තියෙනවා කොළ, දළු, මල්, අතු පතර, පොතු, එලය, අරටුව. බුදු රජාණන් වහන්සේ ගේ ශාසනයේ අරටුව හැටියට තියෙන්නේ ආර්ය විමුක්තිය යි.

එතකොට කෙනෙක් මේ අරටුව කරා යනකම් ම සෑහීමකට පත් නොවී අවබෝධයෙන් ම මේ ධර්ම මාර්ගයේ යන්න විනෙ. සමහරු ඉන්නවා සමාධිය වැඩෙන්නෙ නෑ. එයා පසුබහිනවා. එයා දන්නේ නෑ ධර්මය පුරුදු කිරීමේ දී, තමා තුළ ධර්මය පුරුදු කිරීමේ කුසලතාවයේ වෙනස්කම් තියෙන බව. මේ ධර්මාවබෝධ කිරීමේ කොටස් දෙකක් පෙන්වනවා. පළමු කොටස ඉක්මනට සමාධිය වැඩෙන පිරිස. අනෙක් කොටස ඉක්මනින් සමාධිය වැඩෙන්නේ නැති පිරිස. සමාධිය ඉක්මනට වැඩෙන පිරිසට කියනවා සැප ප්‍රතිපදාවේ ගමන් කරන පිරිස කියල. සමාධිය වැඩෙන්නේ නැති පිරිසට කියනවා දුක් ප්‍රතිපදාවේ ගමන් කරන පිරිස කියල.

## සැප සේ අවබෝධය කරා...

සමාධිය වැඩෙන කෙනාට නීවරණ ධර්ම යටපත් වෙන නිසා එයා ගේ ප්‍රතිපදාව සැප යි. හැබැයි ඒ සමාධි වැඩෙන පිරිස අතරත් ඉන්නවා වේගවත්ව ධර්මාවබෝධ කරන පිරිසක්. තව කොටසක් ඉන්නවා, හෙමිහිට අවබෝධ කරනවා. ඒ කියන්නේ සමාධිය වඩලා පටිච්ච සමුප්පාදය, පංච උපාදානස්කන්ධය, ආයතන නුවණින් විමසා බලද්දී එයාට ඉක්මනින් ම මේවා ගේ යථාර්ථය

අවබෝධ වෙනවා. එතකොට ඒ කෙනාට සමාධියත් දියුණු වෙනවා. ප්‍රඥාවත් දියුණු වෙනවා. තව කෙනෙක් ඉන්නවා හෙඳින් සමාධිය වඩලා විදර්ශනාව වඩද්දී එයාට ආයෙමත් වැඩෙන්නේ සමථය ම යි. විදර්ශනා අවබෝධයට වඩා එයාට සමාධිය ම යි වැඩෙන්නේ. අවබෝධය එයාට හෙමිහිට වෙන්නේ. සමාධිය වඩන අය අතර කොටස් දෙකක් ඉන්නවා, වේගවත්ව අවබෝධ කරන අය හා හෙමින් අවබෝධ කරන අය කියල.

Internet Version of MSP

## දුක සේ අවබෝධය කරා....

දුක් වූ ප්‍රතිපදාවෙත් කොටස් දෙකක් ඉන්නවා. දුක සේ වේගවත්ව අවබෝධ කරන, දුක සේ හෙමිහිට අවබෝධ කරන. දුක් වූ ප්‍රතිපදාව තිබෙන අය කරුණු පහක් පුරුදු කරන්න ඕනෙ කියනවා. සමාධිය ඇති වෙන්නේ නෑ කියල දුක් දොම්නස් ඇති කර ගත්තොත් සතිපට්ඨානය වඩන්න බැහැ. සිහියෙන් ඇලීම යි, ගැටීම යි දුරු කරන්න ඕනෙ. සමහරු සමාධිය වැඩෙන්නෙ නෑ කියලා පසු තැවි තැවී භාවනා කරනවා. එයා මොකද කරන්න ඕනෙ. බුදුරජාණන් වහන්සේ වදාළා එයා බලන්න ඕනේ කයේ ඇත්ත. එයා නිතර නිතර අසුභය වඩන්න ඕනෙ. ඒක තමයි කයේ ඇත්ත බලනවා කියන්නේ.

www.gautamabuddha.org www.mahamevna.org

ඊළඟට එයා ආහාරයේ ඇත්ත බලන්න ඕනෙ. කන බොන දේට අන්තිමට මොකද වෙන්නේ කියල. ඊළඟට එයා මරණසතිය වඩන්න ඕනෙ. මරණසතිය වැඩීමෙන් තමයි කැරකි කැරකී ධර්මයට එන්නේ. අප්‍රමාදී වෙන්නේ. බුදුරජාණන් වහන්සේ මරණය ගැන වදාළේ මෙහෙම යි.

## සැබැවින් ම මේ දිවිය ටික කලයි තියෙන්නේ...

"අජ්ජේව කිච්චං ආතප්පං - කෝ ජඤ්ඤා මරණං සුවේ" හෙට මැරේවිද කවුද දන්නෙ. අද අද ම මේ නිවන් මගේ හැසිරෙන්න. මේ මරණසතිය සිහි කිරීම හරි ම ප්‍රයෝජන යි. මරණසතිය නො වැඩුවොත් එයා ජාති මදයෙන් මත් වෙනවා. ධන මදයෙන් මත් වෙන්න පුළුවනි. ආරෝග්‍ය මදයෙන් මත් වෙන්න පුළුවනි. මේ වගේ මද වලින් මත් වෙනවා, මරණ සතිය නො වඩන කෙනා. මරණ සතිය වඩන කෙනා මද වලින් මත් නොවී සුළු කාලය යි මට ඉන්න තියෙන්නෙ. ඒ සුළු කාලයේ මම සීලය සම්පූර්ණ කරන කෙනෙක් ද? මම මේ සුළු කාලය තුළ සමාධිය කරා යන කෙනෙක් ද? තමා ගෙන් අහනවා එයා. මම මේ සුළු කාලය තුළ ධර්මය වෙනුවෙන් කැප වුන කෙනෙක් ද? නැවත නැවත එයා තමන් අමතනවා, මරණ සතිය වඩන කෙනා කරන්නේ එහෙමයි.

## හටගත්ත හැම දේ ම අනිත්‍යයි.

ඊළඟට හටගත්ත සෑම දෙයක් ම අනිත්‍ය යි කියල නුවණින් විමසනවා. එහෙම විමසන කෙනා මේ අනිත්‍ය ලෝකය තුළ ඉතා ම ධාර්මිකව සීල සම්පන්නව ජීවත් වෙනවා. අනිත්‍ය ලෝකයට බැඳෙන්නෙ නැති වෙන්න සිත පවත්වනවා. මේ ලෝකෙ උපදින්න එයා කැමති නෑ. ඒකට කියනවා "සබ්බ ලෝකේ අනභිරත සඤ්ඤා" කියල. උපදිනවා කියන එක එයාට අප්පිරිය යි. ඒක ඇති වෙන්න පෙරේත ලෝකෙ ගැන, නිරය ගැන, තිරිසන් ලෝකය ගැන දැනුම් තේරුම් කමක් තියෙන්න ඕනෙ. එතකොට තමයි, එයා අකමැති වෙන්නේ. නැත්නම් හිත පිහිටනවා.

## ලස්සන වෙන්න කවුද අකමැති?

කවුරුහරි ලස්සන කෙනෙක් දැක්කම අන්න මේ වගේ ලස්සන වෙනව නම් මාත්. මිහිරි හඬක් ඇහෙන කොට අනේ මේ වගේ හඬක් ලබන ආත්මෙත් මට ලැබෙනව නම්, මේ වගේ උගත්කමක් ලැබෙනවා නම්, මේ වගේ ප්‍රසිද්ධියක් ලැබෙනවා නම්, කියල මුලා වෙනවා. ඒවගේ සත්ව පිරිසක් මේ සංසාරෙ යන්නේ. ඒ ලෝකයෙන් මිදෙන්න නම් ඔය කියපු විදිහට කයේ ඇත්ත, ආහාරයෙහි ඇත්ත, මරණය මේ හැම දෙයක් ම සිහි කරන්න ඕනෙ. එතකොට එයා කෙමෙන් කෙමෙන් ධර්මය කරා පැමිණෙනවා. මම මේ කිව්වෙ සමාධිය ලබන්න දුෂ්කර කෙනා කරන්න ඕනෙ පිළිවෙල.

එයා ගේ හිත තැන්පත් වෙන වෙලාවක් එනවා. ඒ වෙලාව අපිට කියන්න බැහැ. ඒක ලෝකෙ කාටවත් කියන්න බැහැ. මොකද මොහොතක් සිත සමාධිමත් නොවී අවුරුදු 25 ක් භාවනා කළ බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයන් විසි පස් වෙනි අවුරුද්දේ දි අරහත්වයට පත් වූ හැටි ථේර ථේරී ගාථාවල අපූරුවට සඳහන් වෙනවා. ඒක නිසා කෙනෙකුගේ ජීවිතය තුළ සමාධිය, ප්‍රඥව වර්ධනය වෙන ආකාරය කිව හැක්කේ බුදුරජාණන් වහන්සේ ට පමණ යි. සාරිපුත්ත මහ රහතන් වහන්සේ ටත් ඒක ප්‍රකාශ කරන්න බැහැ.

## රහතන් වහන්සේටත් උපදෙස්...

එක්තරා අවස්ථාවක තියෙනවා සාරිපුත්ත මහ රහතන් වහන්සේ ලකුණ්ඨක භද්දිය මහරහතන් වහන්සේ ට අඬ ගහලා සීල, සමාධි, ප්‍රඥ වඩන්න උපදෙස් දෙනවා. ලකුණ්ඨක භද්දිය ස්වාමීන් වහන්සේ අරහත්වයට පත් වෙලා. රහත් වෙලා තියෙද්දිත්, උපදෙස් දෙනවා.

බුදුරජාණන් වහන්සේ ඒකෙදි ගාථාවක් වදාළා හික්මිච්ච කෙනා අයො ආයෙමත් හික්මවන්න දෙයක් නැහැ කියල.

## බුදු සම්දු නැති ලොවක් මට එපා....

ප්‍රඥවෙන් අග්‍ර වූ සාරිපුත්ත මහරහතන් වහන්සේටත් ඉන්ද්‍රිය පරෝපරියත්ති ඥාණය නැහැ. ඒක තියෙන්නේ බුදු රජාණන් වහන්සේ ට ම පමණ යි. ඒක නිසා අපි හැම තිස්සේ ම බුදු රජාණන් වහන්සේට මයි ගෞරව කරන්න ඕනෙ. බුදුරජාණන් වහන්සේ වදාළ ධර්මයට මයි ගෞරව කරන්න ඕනෙ. බුදු රජාණන් වහන්සේ ගේ ශ්‍රාවක සංඝරත්නයට මයි ගෞරව කරන්න ඕනෙ. බුදුරජාණන් වහන්සේ වදාළ ශික්ෂාවට මයි ගෞරව කරන්න ඕනෙ. බුදුරජාණන් වහන්සේ වදාළ සමාධියට ම යි ගෞරව කරන්න ඕනෙ. අන්න එතකොට තමයි නියම මාර්ගය පෑදෙන්නෙ. ඉතින් එබඳු ආකාරයේ පැහැදීමක්, එබඳු ආකාරයේ අවබෝධයක් ඇති කර ගන්න ඕනෙ, තමා ගේ යහපත කැමති කෙනා.

මිනිස් ලෝකෙ හිටපු අය දන්නවානෙ කරදර වලට වැටිලා දුක් විඳපු හැටි. අපේ රටේ මේ සුනාමියත් එක්ක බොහෝ දේවල් හිතන්න ඉතුරු වෙලා තියෙනවා. ඒවා හිතන්න පුළුවන් කෙනාට පමණ ය, අනිත් අයට ඒක තේරෙන්නෙ නෑ. මෙකෙන් අපි අවබෝධ කර ගත යුත්තේ මේ මනුස්ස ජීවිතය කොයි තරම් කෙටි ද? කොයි තරම් ඉක්මනින් නැති වෙලා යනව ද? ඒ නිසා අපි මේ ලැබුණු මනුස්ස ජීවිතයේ දී වත් ඉක්මනින් ආර්ය සීල, ආර්ය සමාධි, ආර්ය ප්‍රඥා, ආර්ය විමුක්ති ඇති කරගෙන මේ සංසාර දුකින් නිදහස් වෙමු. ඔබ සැමට තෙරුවන් සරණයි

**සාදු! සාදු!! සාදු!!!**